ජොයිස් මේයර්

# යේසුස්

## සියලු නාමවලට වඩා උසස් නාමය

එතුමාණන්ගේ ආලේපය ඔබගේ ජීවිත තුළට මුදා හැරීම

# යේසුස්

## සියලු නාමවලට වඩා
## උසස් නාමය

# යේසුස්

## සියලු නාමවලට වඩා උසස් නාමය

එතුමාණන්ගේ ආලේපය
ඔබගේ ජීවිත තුළට මුදා හැරීම

**ජොයිස් මේයර්**

JOYCE MEYER
MINISTRIES®
125, ශාන්ත ජෝසප් වීදිය, ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14.

All Scripture quotations, unless otherwise indicated, are taken from The Amplified Bible (AMP). The Amplified Bible, Old Testament. Copyright 1965, 1987 by the Zondervan Corporation. The Amplified New Testament, copyright © 1954, 1958, 1987 by The Lockman Foundation. Used by permission.

Verses marked "TLB" are taken from The Living Bible © 1971. Used by permission of Tyndale House Publishers, Inc., Wheaton, Illinois 60189. All rights reserved.

Some Scripture quotations are taken from the New American Standard Bible®, (NASB®). Copyright © The Lockman Foundation 1960, 1962, 1963, 1968, 1971, 1972, 1973, 1975, 1977, 1995. Used by permission.

Scripture quotations marked "KJV" are taken from the King James Bible of the Bible.

Scripture quotations are italicized. Words emphasized by the author in Scripture quotations appear in italicized bold type. This emphasis does not appear in the original source of the Scripture quotations.

Copyright © 2013 by Joyce Meyer Ministries - Asia

All rights reserved. No part of this publication may be reproduced, distributed, or transmitted in any form or by any means, or stored in a database or retrieval system, without the prior written permission of Joyce Meyer Ministries - Asia.

Joyce Meyer Ministries - Asia
Srilanka Office Address

Jesus–Name Above All Names - Sinhala
Releasing His Anointing in Your Life

# පටුන


| | | |
|---|---|---|
| හැඳින්වීම | | 7 |
| 1 | නාමය තුළ බලය ඇත! | 11 |
| 2 | නාමය සහ ඇදහිල්ල | 21 |
| 3 | නාමය භාවිතා කිරීම | 33 |
| 4 | නාමය නිකරුණේ භාවිතා කිරීම | 47 |
| 5 | නාමයට ඇති ගෞරවය සහ භක්තිය | 57 |
| 6 | නාමය සහ සබඳතා | 65 |
| මාප්තිය | | 73 |
| ස්වාමින්වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවයක් සඳහා යාච්ඤාව | | 75 |
| අවසාන සටහන් | | 77 |

# හැඳින්වීම

පුද්ගලයෙකුගේ නාමය තුළ ඇත්තේ කුමක්ද? මිනිසුන් විසින් අවබෝධ කර ගන්නවාට වඩා බොහොමයක් ඒ තුළ ඇත.

නාමය යනු පුද්ගලයා නියෝජනය කරන්නකි. ඉන් ඔහුගේ චරිතය පුද්ගලාරෝපණය කරනු ලබයි. ඉන් ඔහුගේ අනන්‍යතාවය දක්වයි. එසේම අන් සියල්ලන් කෙරෙන් ඔහුව වෙන්කර හඳුනා ගනියි.

අප යමෙකු ඔහුගේ නම කියා අමතන කල, අපි හුදෙක් නමක් පමණක් පවසනවා නොවෙමු. අපි එමගින් ඔහු පිළිබඳව යමක් ප්‍රකාශයට පත් කරන්නෙමු.

එසේම අපි යේසුස් වහන්සේගේ නාමය අමතන කල අපි හුදෙක් නමක් පමණක් අමතනවා නොවෙමු. එහිදී අපි ප්‍රකාශ කරනුයේ බලය අන්තර්ගත නාමය වෙමු. ඒ වනාහි හුදෙක් මනුෂ්‍ය බලයක් නොව, දෙවියන්වහන්සේ සතු සියලු බලය හා අධිකාරීත්වය වන සේක. (කොලොස්සි 2:9)

අප එතුමාණන්ගේ නම ඇමතීමේ දී එතුමාණන්ගේ පූර්ණත්වය ඉන් විස්තර කරන සේක. 'යේසුස්' නම් ගැළවුම්කාරුවාණන් සහ එතුමා අප උදෙසා කළ අපගේ පාපයෙන්ද අපගේ දුර්වලකම් වලින් ද අපගේ වරද වලින් සහ එතුමන්ගේ කැමැත්ත නොවන හේතු කාරණා වලින් ද අපව මුදාලන සේක. (ශු:මතෙව් 1:21)

යේසුස්වහන්සේගේ නාමයට වඩා උසස් වෙනත් නාමයක් නොමැති බව බයිබලය අපට උගන්වයි. යේසුස් යන නාමයට ස්වර්ගයෙහිද, පොළොවෙහිද, පොළොවෙන් යටද අධිකාරීත්වය

ඇති බැවින් 'යේසුස්' යන නාමය සඳහන් කළ පමණින් පණ ඇති සියල්ලන් දණ නැමිය යුතු බැව් බයිබලය අපට උගන්වයි. (පිලිප්පි 2:9,10) යේසුස්වහන්සේගේ නාමය, යේසුස්වහන්සේව නියෝජනය කරන සේක. එබැවින් අපි එතුමාණන්ගේ නාමයෙන් යච්ඤා කරන කල, එයින් හැඟී යන්නේ යාච්ඤාව හෝ ඉල්ලීම යේසුස්වහන්සේ විසින්ම කරනවා සේය.

යාච්ඤාව තුළින් අපි යේසුස් වහන්සේගේ නාමය ආමන්ත්‍රණය කරන විට, එකෙනෙහිම අප වෙත එතුමාණන්ගේ බලය නිදහස් කරන සේක.

ඒ කුමන වර්ගයේ බලයක්ද?

එනම්, අන්‍යයන්ට ආශිර්වාද කිරීමේ බලය ද, අප උදෙසා උපකාර ගෙනෙන බලය ද අපේ ජීවිත සඳහා දෙවියන්වහන්සේ විසින් සැලසුම් කර ඇති යහපත් දේ භුක්ති විඳීමේ බලය ද ආදී වශයනේ වේ.

මා විසින් පවත්වනු ලබන රැස්වීම් සහ සමුළුවලදී, බොහෝ අවස්ථාවල මම වේදිකාවේ සිට 'යේසුස්' යන නාමය ආමන්ත්‍රණය කරමි. මා එසේ කරන කල, එතුමාණන්ගේ බලය කාමරය පුරා මුදා හැරෙන ආකාරය සහ එතුමාණන්ගේ වැඩසිටීම ද මට දැනෙයි. ඒ නාමය තුළ මිනිසුන් සුවය ලබාගන්නා බවද, යේසුස්වහන්සේව තමන්ගේ ගැළවුම්කරුවාණන් සේ පිළිගන්නා බවද එකී නාමය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඇතුළත ශක්තියෙන් පූර්ණ වන බවද මම විශ්වාස කරමි. 'යේසුස්' යන නාමය බලය පිළිබඳව අපට වැඩිපුර එළිදරව්වක් අවශ්‍ය වේ.

මම වචනය, නාමය සහ රුධිරය යන මැයෙන් වසර කීපයකට ඉහතදී පොතක් ලියුවෙමි. 'යේසුස්' යන නාමය පිළිබඳව ඉගැන්වීමට සූදනම් වෙමින් සිටියදී, යේසුස්වහන්සේගේ නාමය ගැන එම කෘතියේ සඳහන් කොටස මම යළිත් කියවීමි. එකී පරාසය පිළිබඳව

මගේ ඇදහිල්ල ස්වාමින්වහන්සේ දිරිමත් කළ බව මම විශ්වාස කළෙමි. නාමය තුළ ඇති බලය සහ අධිකාරීත්වය පිළිබඳව අත්දැකීම අලුත් කිරීමේ පාඨමාලාවක් දෙවියන්වහන්සේ මට දෙන බව අවබෝධ විය.

'යේසුස්' යන නාමය තුළ ඇති බලය ගැන අප කොතරම් දැන සිටියද, අප විසින් උගත යුතු තවත් අලුත් දේවල් ද ඇත. නොඑසේනම් අප මේ වන විටත් දැන සිටින දේවල් අළුත් කර ගත යුතුය.

එතුමාණන්ගේ වචනය පිළිබඳව සිද්ධාන්ත අප විසින් අමතක කර දැමීම ස්වාමින්වහන්සේගේ කැමැත්ත නොවේ. මේ කාරණය පිළිබඳව අපගේ ඇදහිල්ල උදාසීනව තිබෙන්නට ඉඩ හැර, එය උද්දීපනයක් නොමැති නම්, අප ජීවිතය තුළ කුමක් කිරීමට තැත් කළ ද, එය ක්‍රියාත්මක වන්නේ නැත.

කරුණු කාරණා මෙතෙක් පැවත ආ ආකාරයට ක්‍රියාත්මක නොවන්නේ යැයි ඔබට පෙනී යන්නේ නම්, ඒ 'යේසුස්' යන නාමය පිළිබඳව දේව වචනය තුළ සඳහන් මූලික සිද්ධාන්ත පිළිබඳ දැක්ම ඔබෙන් ගිලිහී ගොස් ඇති නිසා විය හැකිය. ඔබේ කාලය හා අවධානය කැපකළ යුතු මීට වඩා වැදගත් දේ ඇතැයි ඔබ සිතීමට පුළුවන. නමුත් 'යේසුස්' යන නාමය පිළිබඳව අධ්‍යයනය නොවැදගත් යැයි ඔබට කිසි දිනෙක නොහැඟිය යුතුය.

ස්වාමින්වහන්සේ සමග ඔබට පෞද්ගලික සම්බන්ධතාවයක් නොමැති නම්, ඔබ විසින් මේ දැන් දැනගත යුතු කාරණාවක් ඇත. ඔබ මේ වන විට පොරබදිමින් සිටින ඔබේ ජීවිතයේ කාරණා වෙනස් කිරීමට බලය එතුමාණන්ගේ නාමය තුළ අන්තර්ගතව ඇත. ඔබ විසින් කළ යුත්තේ එතුමාණන්ගේ නාමය තුළින් ඔබට ලබා දී ඇති බලය ලබා ගැනීමයි.

එතුමාණන්ගේ බලයෙන්, ඔබට විරුද්ධව එන සෑම දෙයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔබට හැකිවිය යුතුය.

ඔබට පැහැදිලි අවබෝධයක් ලැබීමට සහ ඔබේ අවබෝධය නැවුම් කරවීම සඳහා 'යේසුස්' යන නාමය තුළ ඇති බලය ගැන මා ඉගෙන ගත් යමක් ඔබ හා බෙදා ගැනීමට මම කැමැත්තෙමි. 'යේසුස්' යන නාමය තුළ ඇති බලයේ අධිකාරීත්වය යාච්ඤාව තුළ සාර්ථක ලෙස භාවිතා කිරීම සඳහා එම බලය පිළිබඳව ඔබ තුළ ඇදහිල්ල කලතා අවදි කිරීමට මේ පොත තුළින් ඔබ ඉගෙන ගත යුතුයි

දේව සේවිකාවක් වශයෙන් මෙකී සුවිශේෂය පිළිබඳ මා තුළ ශක්තිමත් ඇදහිල්ලක් පවත්වා ගත යුතු බව මම දනිමි. මන්ද එසේ නොමැතිව මා හට සේවය කිරීමට නොහැකිය. 'යේසුස්' යන නාමය ආමන්ත්‍රණය කරන කුමන අවස්ථාවක හෝ එමගින් මුදා හරිනු ලබන සුවිශේෂී බලය පිළිබඳව මා නිරන්තරයෙන්ම දැනුවත්ව සිටිය යුතුය.

ඔබ මේ පොත කියවා නිම වන විට, යේසුස්වහන්සේ කෙරෙහිත්, එතුමාණන්ගේ නාමය කෙරෙහිත් ඔබ තුළ ඇති ඇදහිල්ල ප්‍රාණවත් කර ඔබ වෙනස් ආකාරයට යාච්ඤා කිරීමට පටන් ගනු ඇතැයිද, ඔබ එකී නාමය ආමන්ත්‍රණය කරන කල්හි, එහි අන්තර්ගත බලය නික්ම ගොස් සිදුවිය යුතු දේ ඉටු කරනු ඇතැයි ද, කියා මම යාච්ඤා කරමි. ඔබ මේ දක්වා පුල පුලා බලා සිටි කඩඉම් ඔබේ ජීවිතය තුළ සහ අන් අයගේ ජීවිත තුළ ඇති වනු ඔබට අත්විඳීමට හැකිවනු ඇත.

යේසුස්වහන්සේගේ නාමය, සියලු නාම වලට වඩා උසස් නාමය වන 'යේසුස්' යන නාමය තුළ ඇති බලය පිළිබඳව දේව වචනය ස්වාමින්වහන්සේගෙන් ඔබට ලැබීමත් සමගම උන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා......

# 1

# නාමය තුළ බලය ඇත!

"අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැන ගන්නා පිණිස නුඹලාගේ සිත් නැමති ඇස් පහදන ලෙසත්ය."

**(එපීස 1:19)**

ඔබ ඉදිරියේ ඇති වන කාරණා වලට ඔබව පරාජය කිරීමට බැරි තරමේ බලයක් ඔබ සතුවේ නම් තත්ත්වය කෙබඳු වේදැයි සිතා බලන්න. ඒ බලය කොතරම්දයත් එය මහත් ශක්තියකි. එහි බලවත්කම මෙතෙකැයි මැන බැලිය නොහැක. මේ පරිච්ඡේදය තුළ පාවුල් අපෝස්තුළුවරයා අපට පවසනුයේ ඒ වනාහී යේසුස්වහන්සේ තුළින් අප වෙත නිසැකවම ලැබෙන්නක් බවය.

ස්වකීය ජීවිතය තුළ එවන් බලයක් අත්දැකීමට බොහෝ දෙනාට උවමනාය. නුමුත් එය මුදා හරින්නේ කෙසේද? කියා ඔවුන්ට වැටහෙන්නේ නැත. එකී බලය මුදා හැරීමට ඇති වැදගත් මූලික සිද්ධාන්තයක් වනුයේ ඇදහිල්ලෙන් යුක්තව නාමය ආමන්ත්‍රණය කිරීමයි.

අන් සියලු නාම වලට වඩා උසස් නාමයක් යේසුස්වහන්සේට ඇති බව බයිබලය පවසයි. ඒ ස්වර්ගයටත්, පොළොවටත් අති උසස්ම බලවත්ම නාමයයි. එතුමන්ගේ මේ නාමය අප වෙත ප්‍රදානය කර ඇත. අප විසින් කළ යුතුව ඇත්තේ විශ්වාස කිරීම පමණයි.

අප විශ්වාස කරන්නේ කුමක්ද?

ශු:යොහන් 20:31 මෙසේ පවසයි. "මේවා ලියන ලද්දේ යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුස්වහන්සේම ආලේපිත ලද්දාවූ බව නුඹලා විශ්වාස කරන පිණිසත්, ඇදහීමෙන් උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය.''

අපි යේසුස්වහන්සේ තුළ විශ්වාසය තබන කල එතුමන් සමග පුද්ගලික සම්බන්ධතාවයක් වර්ධනය කර ගත් කල, එතුමාණන්ගේ නාමය තුළ යාච්ඤා කරන කල, දෙවියන්වහන්සේගේ බලය තුළට පිවිසීමේ වරය අපට උදවනු ඇත.

යේසුස් වහන්සේ තුළින් දෙවියන්වහන්සේ අපට සපයා දී ඇති සියල්ල අපට ලැබෙනුයේ එතුමාණන්ගේ නාමය කෙරෙහි අප තුළ ඇති ඇදහිල්ල තුළිනි.

එසේ සපයා දී ඇති දේවල් නම් නිරන්තර ප්‍රේමය, සාමය, ප්‍රීතිය, සුවය, සඵලවත්වය, ආරක්ෂාව, ශක්තිය, ඕනෑම තත්ත්වයක් අභියස ජයග්‍රහකයෙකුටත් වඩා උසස් තත්ත්වයකට පැමිණීමේ හැකියාව සහ අප වටා ඇති කුමන හෝ කාරණාවක් වෙනස් කිරීමට ඇති බලය වේ.

මේ පිළිබඳව මොහොතක් සිතා බලන්න. අපි දෙවියන් වහන්සේගේ දරුවන් වූ කල එතුමන්ගේ නාමය තුළ ඇති සියල්ල අප සතු වන්නේය.

## අවබෝධය නොමැති බව සහ බලය නොමැති බව.

**''මාගේ සෙනඟ මා ගැන දැනගැන්ම නැතිකමින් නාස්ති වීසිටිති...."**

**(හොෂෙයා 4:6)**

කිතුණුවන්ද ඇතුළුව මිලියන ගණනක් ජනතාවට එතුමන්ගේ නාමය තුළ අන්තර්ගත බලය ගැන කිසිම ඉඟියක් හෝ අවබෝධයක් නොමැත.

එය සැබැවක් බව මම දනිමි. මන්දයත් මා ද කලක් එවැන්නෙක්ව සිටියෙමි.

මම ද වසර ගණනාවක් තිස්සේ කිතුණුවෙක්ව සිටියෙමි. සෑම සතියකම දේවස්ථානයට ගියෙමි. සමහර අවස්ථාවල සතියට කිහිප අවස්ථාවක් දේවස්ථානයට ගියෙමි. දේවස්ථාන පාලක මණ්ඩල තනතුරු දැරුවෙමි. ශුභාරංචි කණ්ඩායමේ සාමාජිකත්වය දැරුවෙමි. ස්වාමිපුරුෂයා එම සභාවේ වැඩිමහල්ලෙක් විය. නමුත් යේසුස්වහන්සේගේ නාමය තුළ ඇති බලය පිළිබඳව අවබෝධයක් මා තුළ නොවීය.

අද දවසේදී වැඩිම සංඛ්‍යාවක් මෙන් නොව බොහෝ කිතුණුවන් මෙන්ම මා ද බලයෙන් තොර පුද්ගලයෙකු විය. මන්ද මා තුළ අවබෝධයක් නොමැති වූ බැවිනි.

අහෝ...... මම 'යේසුස්' යන නාමය භාවිතා කළෙමි. මට උගන්වා තිබූ පරිදි යාච්ඤාවේ අගට යේසුස්වහන්සේගේ නාමයෙන් යන කොටස ඇමුණුවෙමි. නමුත් මා කරන්නේ කුමක්ද? කියා මා තුළ අවබෝධයක් නොවීය. එබැවින් මා ගත කළේ බලයෙන් තොර කිතුණු ජීවිතයකි. මගේ ජීවිතය තුළ හෝ මගේ පවුලේ සහ අනෙකුත් අයගේ ජීවිත තුළ වෙනසක් ඇති කිරීමට තරම් බලයක් මා තුළ නොවීය.

ඔබට කිතුණු ජීවිතයක් ගත කරන අතරතුරම බලයෙන් තොර ජීවිතයක් ගත කළ හැකි බව ඔබ දන්නෙහිද?

බලයෙන් පූර්ණ ජීවිත ගත කරන කිතුණුවන්ට වඩා බලයෙන් තොර ජීවිත ගත කරන කිතුණුවෝ සංඛ්‍යාවෙන් වැඩි යැයි පවසන්නට සිදුවීම කණගාටුදායකය. නමුත් දෙවියන්වහන්සේගේ අභිප්‍රාය එසේ නොවන සේක. සභාව ආරම්භයේ සභාව තුළ පැවතියේ එවන් තත්ත්වයක් නොවෙයි.

## මුල් සභාව සතුව තිබූ බලය

**"ස්වාමි වූ යේසුස් වහන්සේගේ නැවත නැගිටීම ගැන ප්‍රේරිතයෝ මහත් බලයෙන් සාක්ෂි දුන්නෝය..."**

**ක්‍රියා** 4:33

මුල් සභා යුගයේ  බලවත් සිදුවීම් ඇතිවූයේ ඇයි?

මිනිසුන් සුවය ලැබීම, යක්ෂ ආත්ම දුරු කරනු ලැබීම, බොහෝ මිනිසුන්ගේ ජීවිත තුළ විශාල වෙනස්වීම් ඇතිවීම ආදී දේ ක්‍රියා පොතේ සඳහන්ව ඇත්තේ මක් නිසාද?

මුල් යුගයේ කිතුණුවන්ට බොහෝ පුදුම හා ලකුණු ද, හාස්කම් ද සිදුකළ හැකිවූයේ මන්ද?

මුල් යුගයේ කිතුණුවෝ යේසුස්වහන්සේගේ නාමය තුළ වූ බලය පිළිබඳ දැන සිටියහ. යේසුස්වහන්සේගේ නාමය භාවිතා කළ යුත්තේ කෙසේ දැයි දෙවියන්වහන්සේ අදහස් කළේ යම් සේ ද, ඒ ආකාරයෙන් ඔවුන් නිත්‍ය පදනමක් මත එතුමාණන්ගේ නාමය භාවිතා කළහ. (එකී නාමය භාවිතා නොකළ යුතු ආකාරයක් ද ඇත. ඒ පිළිබඳව පසුව දක්වේ.)

උපතේ පටන් කොරව සිටි මිනිසෙකුට පේතෘස්තුමා, යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කළ කල්හි මිනිසා සුවය ලැබීය. (ක්‍රියා 3:1-8)

දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැනත් එතුමාණන්ගේ නාමය ගැනත් පිලිප් මහත් සමූහයකට දේශනා කළේය.

"පිලිප් දේශනා කළ කල්හි ස්ත්‍රීහුද පුරුෂයෝද බව්තිස්මය ලැබුවෝය....." (ක්‍රියා 8:12)

ශාස්ත්‍ර කියන ආත්මයක් ඇත්තාවූ තරුණියකට ඈ තුළ වූ යක්ෂාත්මයට පිටතට පැමිණෙන ලෙස අණ කිරීමේදී පාවුල්තුමා යේසුස්වහන්සේගේ නම භාවිතා කළේය. එසැනින් අශුද්ධාත්මය පිටතට පැමිණ, ඇය නිදහස් වූවාය....." (ක්‍රියා 16:16-18)

යේසුස් වහන්සේගේ නාමය තුළ වූ බලය ගැන මුල් කාලයේ ගෝලයින් දැන සිටි බව සහ එමගින් ආශිර්වාදය ලැබීමටත්, අන්‍යයන්ට ආශිර්වාද කිරීමටත් ඒ බලය පාවිච්චි කළ යුතු අන්දම ද ඔව්හු දැන සිටියෝය.

## නාමය තුළ ඇත්තාවූ ගැළවීමේ බලය

**"ඔබගේ වචනය නිර්භීතකමින් කථා කරන්ටත් ඔබගේ ශුද්ධ සේවකයා වූ යේසුස්වහන්සේගේ නාමය කරණකොටගෙන හාස්කම්ද පුදුමද කරන්ටත් ඔබගේ දාසයන්ට වර දුන මැනවයි කීවෝය."**

**ක්‍රියා 4:30**

අර්බුද පවතින අවස්ථාවලදී, රෝගීන් සුව කිරීම, යක්ෂාත්ම දුරුකිරීම, පුදුම සහ ලකුණු දක්වීම සිදුකිරීමට යේසුස්වහන්සේගේ නාමය තුළ බලය ඇති බව මේ පරිච්ජේදය තුළින් අපට දැකිය හැකිය.

එකී නාමය ආමන්ත්‍රණය කරන කවරෙකු වුව ද ගැළවීමට ඒ තුළ බලය ඇතැයි දේව වචනය අපට එළිදරව් කරයි. (ක්‍රියා 2:21)

යේසුස් වහන්සේගේ නාමය තුළ ගැළවීම ඇතැයිද ඒ නාමය තුළ හැරුණු විට අන් කවර හෝ නාමයක් තුළ ගැළවීම නැතැයිද බයිබලය පවසයි. (ක්‍රියා 4:12)

සරලව අර්ථ දක්වන්නේ නම් ගැළවීම යනු යේසුස්වහන්සේගේ නාමය කෙරෙහි විශ්වාස කිරීමත් එතුමාණන් කෙරෙහි ඇදහිල්ල තැබීමට තීරණය කිරීමත් ය. (ඔබ මීට පෙර එසේ කර නොමැති නම් එසේ කිරීමට ඔබ කැමති නම් ඔබ විසින් ඒ සඳහා කළ හැකි යාච්ඤාවක් මේ පොත අවසානයේ දක්වා ඇත.)

කොලොස්සි 2:9 මෙසේ දැක්වේ. "මක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය. (දේවත්වය සම්පූර්ණ ලෙස ප්‍රකාශ කරමින්)

අනතුරුව 10 වැනි පදයේ මෙසේ පැවසෙයි. "සියලු අධිපතිකම්ද බලයේ ද හිස වන උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටින්නහුය. (ක්‍රිස්තුස්වහන්සේ තුළ/ඔබ ද දේවත්වයෙන් එනම් පියාණෝය, පුත්‍රයාණෝය, ශුද්ධාත්මයාණෝය, යන දේවත්ව තුළ ආත්මයේ පූර්ණත්වයට පැමිණෙන්නහුය. සියලු අධිපතිකමේද පාලනයේද හිස උන්වහන්සේයි

මේ ඉගැන්වීම තදින් අල්ලා ගන්න. දෙවියන්වහන්සේගේ මුළු බලය යේසුස්වහන්සේ තුළ අන්තර් ගත කර ඇත. එසේම ඒ නාමය සභාවට දී ඇත. කෙතරම් අපූරුද?

එතුමාණන්ගේ උතුම් නාමය බලවත්ය. මේ පොතේ මා ඉදිරියේදී සඳහන් කිරීමට අදහස් කරන හැටියට ඒ සඳහා ඇදහිල්ල අවශ්‍ය වෙයි.

අපේ දෛනික ජීවිතය තුල බලය අල්ප වශයෙන් අප අත් දකින්නේ නම්, ඉන් අදහස් වනුයේ එතුමාණන්ගේ නාමය කෙරෙහි අප තුළ ඇති ඇදහිල්ල මඳ බවය.

යේසුස්වහන්සේගේ නාමයෙන් යැයි ප්‍රකාශ කරමින් තැන තැන ගොස්, යක්ෂාත්ම දුරු කිරීමටත්, යාච්ඤා කිරීමටත් මට පුළුවන. නුමුත් ඒ නාමය කියා මා යාච්ඤා කරන විටදී ද කථා කරන විටදී ද, මගේ ඇදහිල්ල චංචල වේනම් ප්‍රතිඵල මට නොලැබී යනු ඇත.

## ආත්මීක ආයුධයක් හැටියට නාමය

**"මක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය, එහෙත් ඒවා බලකොටු බිඳ හෙළීමට දෙවියන්වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය."**

2 කොරින්ති 10:4

බලවත් කාන්තාවන් හා පුරුෂයන් බලයෙන් පූර්ණව අවදි කරවීමට අද දවසේ දෙවියන්වහන්සේට අවශ්‍ය, අප යුද්ධයක නිරත වී සිටින බැවිනි. ඒ වනාහී ආත්මික යුද්ධයකි. එය මිනිස් සතුරන්ට (මාංසයට හා රුධිරයට) විරුද්ධව නොව, **අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත්, මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12 )**

ස්වාභාවික ලෞකික ලෝකය තුළ මේ යුද්ධය කළ නොහැක. සාතන් සහ අනෙකුත් දුෂ්ඨාත්ම සේනා අපේ සතුරෝය. ආත්මික පසුබිමක් තුළ ඔවුන්ට එරෙහිව සටන් කළ හැක්කේ ආත්මික අවි ආයුධ වලින් පමණක

කිං ජේම්ස් අනුවාදයේ 2 කොරින්ති 10:4 පදයේ දැක්වෙන පරිදි අපේ යුද්ධායුධ වනාහී මාංසික (හෝ ස්වභාවික) ඒවා නොවෙයි.

නමුත් අපව බැඳ තබා ඇති බැඳුම් බිඳ හෙලීමට දෙවියන්වහන්සේ තුළ ඒවා සමත්යි.

දෙවියන්වහන්සේ විසින් අපට ලබා දී ඇති බලවත්ම ආත්මික ආයුධ වලින් එකක් නම්, යේසුස්වහන්සේගේ නාමය භාවිතා කිරීමට දී ඇති වරමයි. (ශු:ලූක් 10:17) එය ආත්මික මිසයිලක හිසක් බඳුයි.

## ඔබේ ඇදහිල්ල අනුව ඔබට සිද්ධ වේවා

**''යේසුස්වහන්සේ එතැනින් යන කල අන්ධයෝ දෙදෙනෙක්: දවිත්ගේ පුත්‍රයාණෙනි, අපට කරුණා කළ මැනව කියා මොරගසමින් උන්වහන්සේ පස්සේ ගියෝය. උන්වහන්සේ ගෙට පැමිණි කල ඒ අන්ධයෝ උන්වහන්සේ ළඟට ආවෝය. මට මේක කරන්ට පුළුවන කියා නුඹලා විශ්වාස කරනවාදැයි යේසුස්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. එසේය, ස්වාමිනියි ඔව්හු කීවෝය. එවිට උන්වහන්සේ ඔවුන්ගේ ඇස් අතගා: නුඹලාගේ විශ්වාසයේ ප්‍රකාරයට නුඹලාට වේවායි කීසේක. ඔවුන්ගේ ඇස් පැහැදුණේය...''**

**මතෙව් 9:27-30**

යේසුස්වහන්සේගේ නාමය තුළ ඇති බලය පිළිබඳව මම දනිමි. ඒ නාමය තුල මම වසර විස්සකට  වැඩි කාලයක් යාච්ඤා සහ දේශනා කර ඇත්තෙමි. නමුත් දෙවියන්වහන්සේ ඊට ටික කාලයකට පෙර මා වෙත වැඩම කර සෑම ඇදහිලිවන්තයෙකු සඳහාම එකී නාමය තුළ ඇති පූර්ණ බලය සහ අධිකාරීත්වය පිළිබඳව මට නැවුම් අත්දැකීමක් ලබා දෙමින් මගේ ඇදහිල්ල ප්‍රබෝධමත් කළ සේක.

ස්වාමින්වහන්සේ මා වෙතට වැඩිය සේකැයි මා දැන් පවසද්දී, මා අත්භූත දර්ශනයක් දුටු බවක් මම නොකියමි. මා ඉන් අදහස් කරනුයේ, එතුමාණන් හුදෙක් යේසුස්වහන්සේගේ නාමය ගැන මගේ හදවත සමග ගණුදෙනු කිරීමට පටන් ගත් බවයි.

එතුමාණන්ගේ නාමය පිළිබඳ ලියවිලි පාඨ මම ටික කාලයක් තිස්සේ භාවනා කරමින් සිටියෙමි. මා විශේෂ කොට එසේ කරනුයේ, බැහැර ගොස් අන්‍යයන්ට සේවය කිරීමට පෙරාතුවය. මා මිනිසුන් ඉදිරියේ නැගී සිටින විට, ඔවුන් උදෙසා යාච්ඤා කිරීමට මට හැකිවන පිණිසත්, මගේ මුළු හදවතින්ම විශ්වාස කරමින්, ශ්‍රවනාගාරය පුරා බලය මුදා හරිනු ලැබ, මිනිසුන්ගේ ජීවිත කෙරෙන් බන්ධන නැමැති විය ගහ බිඳී යනු පිණිසත්, එසේ කිරීම මගින් මගේ ඇදහිල්ල ප්‍රබෝධමත් වෙයි.

යම් කිසිවක් සිද්ධ වෙන්නට යන බව සැබවින්ම විශ්වාස නොකරමින් හෝ ඒ බවට ඇදහිල්ලක් නොමැතිව මට වේදිකාව මත නැගී සැබෑ ලෙස මිනිසුන් වෙනුවෙන් යාච්ඤා කළ නොහැක.

යේසුස්වහන්සේගේ නාමය කෙරෙහි අප තුළ ඇදහිල්ලක් ඇති කළ, ඒ නාමය තුළ අපට ලැබී ඇති බලය සමගින් අපේ ඇදහිල්ලට අභියෝග කරන කුමන හෝ හේතු කාරණාවකට එරෙහිව යාමට අපට පුළුවන.

## බලවේගයක් ලෙස -ඇදහිල්ල-

**මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද ක්‍රිස්තුස්වහන්සේගේ වචනයෙන් ඇසීමද පැමිණෙන්නේය.**

**රෝම 10:17**

ඇදහිල්ල වනාහි බලවේගයකි. එය යාච්ඤාව සහ අපගේ මුඛයේ වචන මගින් මුදා හරිනු ලබන අතර අප තුළ තැන්පත්ව ඇති, බලයක් බව යේසුස්වහන්සේ පෙන්වා දුන්හ. (ශු:මතෙව් 9:29)

කිං ජේම්ස් අනුවාදයේ රෝම 10:17 පදයේ මෙසේ කියැවේ. මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද ක්‍රිස්තුස්වහන්සේගේ වචනයෙන් ඇසීමද පැමිණෙන්නේය.

සුවය ලැබීම පිළිබඳව දේව වචනය ඔබ සවන් දෙන්නේ නම්, සුවය ලැබීම සඳහා ඔබේ ඇදහිල්ල ප්‍රබෝධමත් කරනු ලබයි. මුදල් පිළිබඳව දේව වචනයට ඔබ සවන් දෙන්නේ නම්, මුදල් පිළිබඳ ඔබේ ඇදහිල්ල ප්‍රබෝධමත් කරනු ලබයි.

යේසුස්වහන්සේගේ නාමය තුළ ඇති බලය පිළිබඳව දේව වචනය ඔබ ශ්‍රවණය කරන්නේ නම්, යේසුස් වහන්සේගේ නාමය පිළිබඳව ඔබේ ඇදහිල්ල ප්‍රබෝධමත් කරනු ලබයි. ඔබ මේ පොත කියවද්දී යේසුස්වහන්සේගේ නාමය තුළ ඇති බලය පිළිබඳව ඇති ලියවිලි පාඨ ශබ්ද නගා ප්‍රකාශ කරන්න. ඔබ මේ පොත කියවා නිම කරන අවස්ථාව වන විට, ඔබ මෙතෙක් කළාට වඩා හාත්පසින්ම වෙනස් ආකාරයකින් යාච්ඤා කිරීමට පටන් ගනු ඇත. යාච්ඤාව තුළින් ඔබ ඉල්ලන දේ පිළිබඳව ඔබ තුළ වඩාත් ඇදහිල්ලක් ඇතිවීමට පටන් ගනු ඇත.

එතුමාණන්ගේ නාමය කෙරෙහි ඇදහිල්ල තුළින් ඔබ සතුවේ යැයි බයිබලය සඳහන් කරන බලය කෙරෙහි විශ්වාසය තැබීම නිසා එඩිතර විශ්වාසයේ මානසික ස්වභාවයක් ඔබ තුළ ඇති වීමට පටන් ගනු ඇත. ඔබේ ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්මේ සමාප්ත කෙළවර තරණය කිරීමට බලය යෙදවීමට ඔබට හැකි වනු ඇත. එසේම එතුමන් විසින් ඔබ වෙනුවෙන් වෙන්කොට ඇති අශිර්වාද භුක්ති විඳීමට ඔබට හැකිවනු ඇත! **සියලු නාමයන්ට වඩා උසස්වූ නාමය වන යේසුස් වහන්සේගේ** උත්කෘෂ්ඨ නාමය, ඔබ තුළ ඇති ඇදහිල්ල ප්‍රබෝධමත් කරනු ලබන්නේයි

# 2

# නාමය සහ ඇදහිල්ල

> **"මක්නිසාද දෙවියන් වහන්සේගේ පොරොන්දු කොපමණ වුණත් උන්වහන්සේ තුළ එසේය කියා වේ. එහෙයින් අප කරණකොටගෙන ආමෙන්ය කියාත් වේ."**
>
> 2 කොරින්ති 1:20 නව කිං ජේම්ස් අනුවාදය

බයිබලය තුළ අප කියවන පොරොන්දු බොහෝමයක් ඇත. නමුත් ඒවා අප ජීවිත තුළ ඉෂ්ඨ වනු අපට කිසිදු දක්නට නොලැබේ.

ඒ ඇයි? ගැටළුව කුමක්ද?

සියලු වරප්‍රසාද හුදෙක් බයිබලයේ ලියවී ඇති නිසා නොව ඒ කෙරෙහි විශ්වාසය තැබීමෙන් ඒවා මුදා හරිනු ලබන බව සියල්ලන්ටම පළමුවෙන් අප විසින් අවබෝධ කර ගත යුතුව ඇත.

එසේම අපි යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමෙන් පමණක්ම ඒවා මුදා හරිනු නොලැබේ. ඒවා අප වෙත මුදා හරිනු ලබන්නේ ඒ පොරොන්දු සැබෑයයි අප විශ්වාස කරන බැවිනි. දෙවියන්වහන්සේ පවසා ඇති දේවල් කෙරෙහි අප ඇදහිල්ලෙන් යුක්ත වන බැවිනි.

එපීස 1:19 පදයෙහි පාවුල් අපෝස්තුළුවරයා මෙසේ ලියා ඇති බව අපට දක්නට ලැබේ. "අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැන ගන්නා පිණිස නුඹලාගේ සිත් නැමැති ඇස් පහදන ලෙසත්ය. යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කරන අප උදෙසා ලබා දී ඇති මෙතෙකැයි කිව නොහැකි තරම් වූ බලය පිළිබඳ නුඹලා විසින් දැන ගන්නා පිණිස මම යාච්ඤා කරමි" කියා අපෝස්තුළුවරයා මින් අදහස් කළේ යැයි මම විශ්වාස නොකරමි. යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන, **"එකී බලය අපගේ යැයි විශ්වාස කර අප උදෙසා ලබා දී ඇති මෙතෙකැයි කිව නොහැකි තරම් වූ බලය පිළිබඳව නුඹලා දැනගන්නවාට මා කැමති"** යැයි අපෝස්තුළුවරයා පවසා ඇති බව මම විශ්වාස කරමි.

යේසුස්වහන්සේ ස්වාමින් හා ගැළවුම්කරුවාණන් ලෙස අප තුළ ඇති සාමාන්‍ය ඇදහිල්ල නිසා බයිබලයේ අපට පොරොන්දු දී ඇති සියල්ල අපගේ ජීවිත තුළ හුදෙක් සිදුවීම් මාලාවක් සේ ඉෂ්ඨ වනු ඇතැයි සමහර විට අපි සිතමු.

ඇදහිල්ල ක්‍රියා කරන ආකාරය එය නොවේ. ඇදහිල්ල තුළින් අප ඒ ඒ පොරොන්දු අදාළ කරගත යුතුය. අයිතිකර ගත යුතුය.

දේව වචනය තුළින් මම ඔබට උදාහරණයක් ගෙන එන්නෙමි.

## අදහන්නාට ඇති ලකුණු

**"අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කරන්නෙන්ය; අන් භාෂා වලින් කථා කරන්නෝය; සර්පයන් අල්ලා ගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක්**

**නොවන්නේය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝය...”**

**ශුඃමාර්ක් 16:17, 18 - කේ.ජේ.වී**

යේසුස්වහන්සේ ගෝලයින්ට බලය සහ අධිකාරීත්වය ප්‍රදනය කිරීමෙන් සුළු වේලාවකට අනතුරුව සහ පියාණන්වහන්සේගේ දකුණු පසෙහි වැඩ හිඳීම පිණිස එතුමා ස්වර්ගයට නැගීමට මොහොතකට පෙර එතුමන් විසින් මෙකී පොරොන්දු දුන් සේක. (ශුඃමාර්ක් 16:19-කේ.ජේ.වී)

හුදෙක් යේසුස්වහන්සේ කෙරෙහි අදහන අයට මෙහි සඳහන් දේ සුවිශේෂ ලකුණු සිද්ධ වන්නේ යැයි මම විශ්වාස නොකරමි. මගේ විශ්වාසය නම් මෙකී සුවිශේෂ ලකුණු සිද්ධ වන්නේ යේසුස්වහන්සේ කෙරෙහි අදහනවා මෙන්ම මෙකී ලකුණු තමන් පසු පස එන බව අදහන්නන් තුළය.

යේසුස්වහන්සේගේ සභාව නොඇදහිලිවන්ත ඇදහිලිවන්තයින්ගෙන් පිරී පවතී. මා ඒ බව දන්නේ මා කලින් සඳහන් කළ පරිදි මා ද වසර ගණනක් මුළුල්ලේ කිතුණුවෙකුව හුන් බැවිනි. මම යළි උත්පාදනය ලැබුවෙමි. මා මිය ගියේ නම් මා ස්වර්ගයට යාමට ඉඩ තිබුණි. නමුත් එකල මා ගත කලේ මුළුමණින්ම බලයෙන් තොර ජීවිතයක්ය.

මම යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කළෙමි. නමුත් එතුමාණන්ගේ නාමය තුළ ඇති බලය කෙරෙහි විශ්වාස නොකළෙමි. මන්ද ඒ බලය පිළිබඳව කිසිවෙකු මට උගන්වා නොතිබුණු බැවිනි. කිසිවෙකු ඒ පිළිබඳව දේශනා කරනු මා කිසි දිනෙක අසා නොතිබිණි. කිසියම් හෝ බලයක් ඇති එකම තැනන්වහන්සේ දෙවියන්වහන්සේ පමණක් බව මගේ අදහස විය. එසේම එතුමාණන් මගේ ජීවිතය තුළ එය පාවිච්චි කිරීමට තෝරා

ගත්තේ නම් ඒ පිළිබඳව මට කළ හැකි කිසිවක් නොමැති බවද මගේ හැඟීම විය.

යේසුස්වහන්සේගේ නාමය තුළ යාච්ඤා කිරීම පිළිබඳව කිසිත් මා දැන සිටියේ නැත. මගේ යාච්ඤා අගට යේසුස්වහන්සේගේ නාමයෙන් කියා සඳහන් කළද මා කුමක් කරන්නේද? කියා මා දැන සිටියේ නැත.

මා ශුද්ධාත්මයෙන් බව්තීස්ම ලැබූ කල ඇදහිලිවන්තයා සතු අධිකාරී බලය ගැන අත්දැකීම් ලබන්නට පටන්ගත් කල මා තුළ බලය ඇති බව මම විශ්වාස කිරීමට පටන් ගතිමි.

අපි ශුද්ධාත්ම බව්තීස්මය ලබා අපේ ජීවිතය තුළ එතුමාණන්ගේ කැමැත්ත පූර්ණ කිරීමට දිව්‍ය බලය ලබාගන්නෙමු. ඒ ආකාරයෙන්ම අපි ගැළවීම ලබන්නෙමු. අපි දෙවියන්වහන්සේගෙන් ඉල්ලමින් යාච්ඤා කරන්නෙමු.

යේසුස්වහන්සේ කෙරෙහි අදහන්නන් ලෙස අපි ශුද්ධාත්ම බව්තීස්මය ලැබූ කල වඩා විශාල ආකාරයෙන් දෙවියන්වහන්සේගේ බලය ලබා ගැනීමටත්, අවබෝධ කර ගැනීමටත්, අත්දැකීමටත් ශුද්ධාත්මයාණෝ අපට හැකියාව ලබා දෙන සේක.

දෙවියන්වහන්සේගේ බලය මා සතුව ඇතැයි විශ්වාස කිරීමට පටන් ගත් කල, යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරමින් මම ඒ බලය පාවිච්චි කිරීමට පටන් ගත්තෙමි. මා එය පාවිච්චි කිරීමට පටන් ගත් කල මගේ ජීවිතය සහ මා අවට සිටින්නන්ගේ ජීවිත තුළ බලවත් දේ සිද්ධ වෙන බව මා විසින් දක්නා ලදී.

**යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම පමණක් නොසෑහෙයි. එතුමාණන්ගේ නාමය තුළ ඇති බලය පිළිබඳවත් අපට ඒ බලය ඇතැයි යන කාරණයත් අප විසින් විශ්වාස කළ යුතුය.**

ඔබ විශ්වාස කරන්නෙත් මුවින් ප්‍රකාශ කරන්නෙත් ඔබ දුබලය කියාද?, නොඑසේනම් බලවත් කියාද?

අපට ලබා දී ඇති මෙතෙකැයි කිව නොහැකි තරම් වූ බලය නොසළකා "මට තවත් නම් මෙය දරා සිටීමට පුළුවන් කමක් නැහැ. මට එය දැරිය නොහැකි තරම් විශාලයි..." කියමින් අපි අප ඉදිරියේ උද්ගත වන අසීරු කාරණාවලට ප්‍රතිචාර දක්වන්නෙමු නම් "මා කැබලි වලට කැඩී යන බව මට දැනෙයි. සියල්ල මගේ හිස මත කඩා වැටෙයි. මෙය මට අමාරු වැඩියි. මට එය දරන්න බැහැ. මට බැහැ............ මට බැහැ........... මට බැහැ............." යැයි පවසන්නේ නම්, අපට ඒ බලය පිළිබඳ අවබෝධයක් නොමැත.

මෙහි දී උද්ගත වන ගැටළුව නම් අපට බලය ඇති බව අප විසින් සැබවින්ම තේරුම් නොගැනීමයි. අප බලය ගැන කතා කරනවා විය හැකිය. ඒ ගැන ගායනා කරනවා විය හැකිය. නමුත් සත්‍යය නම්, බයිබලය පවසන දේට එහා යමක් ගැන අප විශ්වාස කිරීමයි.

**සමහර අවස්ථා වලදී අපි අපේ සිතුවිලි අපේ දෙවියන් කොට ගනිමු.**

එබැවින් සමහරවිට ලකුණු අප අනුව නොඑන්නේ ඒවා අප අනුව එන බව අප විශ්වාස නොකරන බැවිනි.

## හුදෙක් විශ්වාස කරන්න.

**"යේසුස්වහන්සේ උත්තර දෙමින්: ඔබට පුළුවන් නම්! විශ්වාස කරන්නාට සියල්ල පුළුවනැයි කීසේක."**

**ශු:මාර්ක් 9:23**

සේවය කිරීම සඳහා මා මිනිසුන් සමූහයක් ඉදිරිපිට නැගිට සිටින හැම විටම මා විශ්වාස කරනුයේ මා ශුද්ධාත්මයාණන් විසින් මග

පෙන්වනු ලබන බවත්, මා තුළ ක්‍රියා කරමින් උන්වහන්සේ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලමින් ඔවුන්ට සේවය කරන බවත්ය. (1 කොරින්ති 12:4-11)

මා වේදිකාව මතට අවතීර්ණ වන කල මා දේශනා කරන්නට යන්නේ කුමක්දැයි මම දනිමි. නමුත් මෙහෙයේ ඉතිරි හරිය ගැන කිසිම හෝඩුවාවක් පමණක් මා දන්නේ නැත. අදහන්නාට ඇති ලකුණු මා අනුව සිදුවෙන්නට යන බව පමණක් මම විශ්වාස කරමි. මන්ද බයිබලය එසේ පවසයි. (ශුංමාර්ක් 16:17,18) දෙවියන්වහන්සේ එතුමාණන්ගේ ආත්මයාණන් කරණකොට ගෙන මට මග පෙන්වන බව මම විශ්වාස කරමි.

ප්‍රතිඵලයක් වශයෙන් (මම මෙය උද්ධච්ජකමින් හෝ අහංකාරයෙන් නොපවසමි.) අපේ දේව මෙහෙයන් නරක හෝ නිශ්ඵල ඒවා නොවෙයි. සෑම ශුභාරංචි රැස්වීමකටම පසුව අපි නිවෙස් බලා යන්නේ සතුටින් හිස සලමින් "දෙවියන්වහන්සේ ඉතා යහපත් වන සේක. උන්වහන්සේ අප තුළ මහත් දේ කළ සේකැ..."යි කියමින්ය.

දේව මෙහෙයක් පවත්වන කාලය තුළ දෙවියන්වහන්සේගේ බලය බලවත් ලෙස දැනෙයි. සෑම රැස්වීම් වාරයක් පාසාම ආලේපය වඩ වඩාත් ගොඩ නැගෙනු දක්නට ලැබේ. දේව මෙහෙයක් තුළ 1,30,000 පමණ දෙනා ශුද්ධාත්ම බව්තීස්මය ලැබූ අවස්ථා ඇත. එහිදී මිනිස්සු නිතරම පාහේ මානසික, කායික මෙන්ම ආත්මික සුවයද ලබා ගනිති.

මේ සියල්ල සිද්ධ වන්නේ අප විශ්වාස කරන බැවිනි. යේසුස්වහන්සේගේ නාමය කෙරෙහි අදහා ගන්නා බැවිනි. එතුමාණෝ කවරෙක්ද? යන්න අදහා ගන්නා බැවිනි. ඒ සියල්ල සිදු වන්නේ යේසුස්වහන්සේ නිසාවෙනි. එතුමාණන්ගේ විශ්මිත නාමය තුළ ඇති කරුණාව සහ බලය නිසාවෙනි.

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙස බලන්න.

**"උන්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන උන්වහන්සේගේ නාමයම නුඹලා දකින්නා වූ අඳුනන්නා වූ මේ මනුෂ්‍යයා සවි කෙළේය..."**

ක්‍රියා 3:16

උන්හන්සේගේ නාමය තුළ ඇති බලය භුක්ති විඳීමට අපට උවමනා නම්, අපට අප දෙසවත්, අපට අයිති නොවන දේ දෙසවත් බැලිය නොහැක. අප යේසුස්වහන්සේ දෙසත්, උන්වහන්සේ කවරෙක්ද? යන්න දෙසත්, අප උදෙසාත්, අප තුළිනුත්, උන්වහන්සේ කරන්නට කැමති දේ දෙසත් බැලිය යුතුය. ප්‍රශංසාව හා වන්දනාව මෙහෙය වීමට පටන් ගන්නා විටම යක්ෂාත්ම දුරු වන්නට යන බවත්, මිනිසුන් ගැළවීම ලැබීමටත්, සුවය ලැබීමටත්, ශුද්ධාත්මයෙන් පූර්ණ වීමටත් යන බව විශ්වාස කරන මෙන් මගේ සේවයේදී අපේ වන්දනා කණ්ඩායම මම දිරිමත් කරමි.

මා පවත්වන සමුළුවලදී කිසිවෙකු තුළ හැඟීමක් ඇති කිරීමට හෝ කිසිවෙකුට බලපෑම් ඇති කිරීමට හෝ කිසිවක් කිරීමට මම කාලය වැය නොකරමි. මා එහි පෙනී සිටින්නේ එක කාරණාවක් සඳහා පමණි. එනම් බඳිනා ලද්දවුන් මුදන පිණිසය. මා කරනුයේ මිනිසුන්ට උපකාර කිරීම බව මා සැබවින්ම විශ්වාස නොකරන්නේ නම් මම මගේ දරු මුණුබුරන් සමගින් නිවසේ රැඳී සිටිමි. නමුත් මා කරන්නේ දහස් ගණන් මිනිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම බව මම මුළු හදින්ම, එකහෙලා විශ්වාස කරමි. මා යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන කල යම් යම් දේ සිදුවන බව මම විශ්වාස කරමි. ඒවා එසේම සිදුවෙයි.

**මම අරමුණක් නොමැතිව, කරන්නන් වාලේ එසේ කරගෙන නොයමි. එය ක්‍රියාත්මක වන බවත්, ජීවිත වෙනස් කරන බවත් මම විශ්වාස කරමි.**

## යාච්ඤා කරන්න- විශ්වාස කරන්න.

"එබැවින් නුඹලාට කියමි-නුඹලා යාච්ඤා කොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේ යයි අදහන්න, ඒවා නුඹලාට ලැබෙන්නේය."

ශුඃමාර්ක් 11:24

"හොඳයි මම යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරනවා. මට තවමත් ප්‍රතිඵල ලැබී නැහැ"

යැයි ඔබ පවසන්නට පුළුවන. දවසේ එක් අවස්ථාවක ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරනවා විය හැකිය. නමුත් එය තේරුම් නොගෙන දවසේ ඉතිරි කාලය තුළ එතුමාණන්ගේ නාමය නිරර්ථක ලෙස භාවිතා කරනවා විය හැකිය. නොඑසේ නම් ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන නමුත් කිසියම් මැජික් මන්තරයක් මෙන් ඔබ එතුමාණන්ගේ නාමය යාච්ඤාවේ අගට යොදා ගන්නවා විය හැකිය.

එසේනම් මෙතැන් පටන්, ඔබ යේසුස් වහන්සේගේ නාමය භාවිතා කරන කල ඇදහිල්ලෙන් යුතුව අසීමිත බලයක් ඔබ වෙනුවෙන් සූදානම් කර තිබෙන බව විශ්වාස කරමින් එතුමන්ගේ නාමය ආමන්ත්‍රණය කරන්න.

මා එසේ කරන කල එකී නාමය තුල ඇති බලය මට දැනෙයි. එම බලය මගේ සිරුර පුරා දිවෙනු මට දැනෙයි.

එකී නාමය තුළ බලය ඇතැයි පවසමින් බයිබලය විහිළු කරනවා නොවෙයි.

මා යේසුස්වහන්සේගේ නාමය ආමන්ත්‍රණය කරන කල ඊට සවන් දෙන සහ එය සිය හදවතින් ලබා ගන්නා සියලු මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා සපුරා ලීම පිණිස එතුමාණන්ගේ නාමය තුළ ඇති බලය ගුවන් තරංගමාලා ඔස්සේ ගළා යන බව මම විශ්වාස කරමි.

යේසුස්වහන්සේගේ නාමය තුළ ගැළවීම ඇත. ඒ නාමය තුළ ගැළවීමද අප්‍රාණික ගතිය අසහනකාරී ගතිය සහ මානසික පීඩනය ආදියෙන් මිදීමද ඒ නාමය තුළ ඇත. එතුමාණන්ගේ නාමය තුළ ඇති සියලුම දේ ලබා ගැනීම සඳහා ඔබ විසින් කළ යුතුව ඇති එකම දෙය නම් විශ්වාස කිරීමයි.

## නාමය සහ වචනය

**"නුඹලා මා තුළෙහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුළෙහි පවතින්නෝ නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලන්න, එවිට නුඹලාට ලැබේ."**

**ශු:යොහන් 15:7**

කිතුණුවන් වන අප සමහර අවස්ථා වලදී යේසුස්වහන්සේ විසින් දී ඇති එකී පොරොන්දුවේ අර්ථය විකෘති කරගෙන ඇති බව මට සිතෙයි. අපට අවශ්‍ය ඕනෑම දෙයක් ඉල්ලිය හැකි යැයි ද අප එතුමාණන්ගේ නාමය අපගේ යාච්ඤාව අගට අමුණන බැවින් ද, ස්වාමින්වහන්සේ අප ඉල්ලන දේ දිය යුතු යැයි ද අපි සිතමු.

ලියවිල්ල අර්ථකථනය කළ යුත්තේ වෙනත් ලියවිල්ලක ආලෝකය තුළ එය අර්ථ දැක්වීම මගින්ය.

එතුමාණන්ගේ අභිමතය පරිදි අප ඉල්ලන කොයි දෙයක් වුවත් අපට ලැබෙන බව 1 යොහන් 5:14,15 පදවල හරය වශයෙන් දැක්වේ. ඒ බව සැළකිල්ලට නොගෙන ශු:යොහන් 15:7 පදය අර්ථය වෙනත් මුහුණුවරකින් දැක්විය නොහැක.

කිං ජේම්ස් අනුවාදයේ ශු:යොහන් 15:7 පදයේ දැක්වෙනුයේ "නුඹලා මා තුළෙහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුළෙහි පවතින්නෝ නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලන්න, එවිට නුඹලාට ලැබේ" යනුවෙනි.

මා විසින් මෙතෙක් කියවන්නට යෙදුණ අති ගෞරව සම්ප්‍රයුක්ත ලියවිලි පාඨය එය බව මම කලක් විශ්වාස කළෙමි. වචනය පවතී යනුවෙන් අදහස් කෙරෙනුයේ, "වාසය කිරීම නොහොත් රැඳී සිටීමයි. ස්ථිර වශයෙන් නොකඩවා පැවතීමයි. ස්ථිරසාරව අචලව පැවතීමයි." අවසාන වශයෙන් මා යේසුස්වහන්සේ තුළ වාසය කිරීමට පටන් ගත් කල මගේ කැමැත්ත එතුමාණන්ගේ කැමැත්ත බවට පත්ව ඇති බව මම අවබෝධ කොට ගතිමි. එසේ වූයේ ස්වාමින්වහන්සේගේ කැමැත්ත නොවූ කිසිවක් සැබවින්ම මට උවමනා නොවන පිණිසය. අද දක්වා මා යාච්ඤාවෙන් ඉල්ලන දෙයක් පිළිබඳව මා දිරිමත් කිරීමට ලියවිලි පාඨයක් මට ඇත්නම් මම ස්වාමින් ඉදිරියට ගොස් මෙසේ පවසමි. "මේ ඔබවහන්සේගේ වචනයයි. මගේ ජීවිතය තුළ එය ඉෂ්ඨ වේවා" යන්න මම අපේක්ෂා කරමි.

නමුත් අප ඉල්ලන බොහෝ දේ පිළිබඳව කිසියම් සුවිශේෂී ලියවිලි පාඨයක් නොමැතිව අප යාච්ඤා ඉල්ලීම් කරනු ඇත. එවන් අවස්ථාවලදී අප යාච්ඤා කළ යුත්තේ මෙසේය, "ස්වාමිනී මේ අවස්ථාව තුළ මට අවශ්‍ය මේ දේ යැයි මම විශ්වාස කරමි. එය නිවැරදි නම්, ඔබවහන්සේ මට එය දෙන බව මම විශ්වාස කරමි. නමුත් එය නිවැරදි නැත්නම්, මට එය උවමනා නැත. මන්ද මට අවශ්‍ය කරනුයේ ඔබවහන්සේගේ කැමැත්ත ඉටුවීම පමණයි..."

## "මාගේ කැමැත්ත නොව ඔබවහන්සේගේ කැමැත්තයි.

**"ගලක් ගසන දුර පමණ උන්වහන්සේ ඔවුන්ගෙන් වෙන් වී, දණින් හිඳ යාච්ඤා කරමින්ඃ පියාණෙනි, ඔබ කැමති සේක් නම්, මේ කුසලාන මාගෙන් පහ කළ මැනව. එසේ වී නුමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි කී සේක."**

**ශු.ලූක් 22ඃ41,42**

මාගේ බාල පුතා විවාහ වන විට ඔහුට වයස අවුරුදු 19කි. ඔහු නොමේරූ අයෙකු බව අපි දැන සිටියෙමු. ඔහු හා විවාහ වූ යුවතිය වයස අවුරුදු 18ක් වූවා පමණි. නමුත් ඇ දේව සේවකයෙකුගේ පවුලකට අයිතිය. ස්වාමින්වහන්සේ සමග දැඩි සම්බන්ධකම් ඔවුන් තුළ විය. ඔවුන් ඉතාමත් දක්ෂ සිත් ගන්නා සුළු එමෙන්ම බුද්ධිමත් අය විය.

ඔවුන්ගේ විවාහ මංගල තෑගි වශයෙන් ඔවුන්ට කිසියම් මුදලක් ලැබිණ. ඔවුන්ගේ ඉතිරි කිරීම් තුළද ඊට වැඩි මුදලක් විය. එබැවින් නිවසක් සඳහා මූලික ගෙවීමක් කිරීමට සෑහෙන මුදලක් ඔවුන් සතු විය. තවද කුඩා වූ ඒ නිවස, අධික මුදලක් නොවිණි.

මුදල් පරිහරණය පිළිබඳ යහපත් ප්‍රතිපත්ති බොහොමයක් මගේ ස්වාමිපුරුෂයා ඔහුට උගන්වා තිබිණි. තමාටම කියා නිවසක් මිළදී ගත හැකි නම් කුලී නිවසක් වෙනුවෙන් මුදල් වීසි කිරීමට ඔහුට උවමනා නොවීය.

එබැවින් අපි ගෙයක් සොයමින් ඔවුන් කැටුව ගියෙමු. ඔවුන්ට ගෙයක් ලැබුණි. ඔවුන් ඊට කැමති විය. ඒ සඳහා විය පැහැදම් දැරීමට ද ඔවුන් තුළ හැකියාවක් තිබුණි. ඒ පිළිබඳව ඔවුන් සැබවින්ම පුදුමයට පත් විය.

පසු දින ඔහු අපට මෙසේ පැවසීය. "චැරී සහ මම ඊයේ රාත්‍රියේ එම නිවසට ගොස් ඒ ඉදිරිපිට හිඳ මෙසේ යාච්ඤා කළෙමු. "ස්වාමිනි, මේ ගෙය මිලට ගැනීම ඔබවහන්සේගේ කැමැත්ත නම්, අපට එය උවමනාය. අප එය ලබා ගැනීම ඔබවහන්සේගේ කැමැත්ත නොවන්නේ නම්, ඊට වඩා යහපත් යමක් ඔබවහන්සේ අප වෙනුවෙන් සූදනම් කර ඇති බව අපි දනිමු. අපට උවමනා කරනුයේ ඔබවහන්සේගේ කැමැත්ත පමණි..."

කෙසේ හෝ ඔවුන් ගෙය මිල දී ගැනීමට නැවත පැමිණීමට පෙර වෙනත් අයෙකු එය මිලදී ගෙන තිබුණි.

"අපේ බලාපොරොත්තු සුන් වුණා....", ඔහු පසුව පැවසුවේය. "නමුත් මා විශ්වාස කරනවා ඒ ගෙය විකිණී ගියේ ඊට වඩා හොඳ යමක් දෙවියන්වහන්සේ අප සඳහා පිළියෙල කර තිබෙනවා. අපි එතෙක් බලා සිටිනවා...."

මගේ පුතා සහ ඔහුගේ මනාලිය එම නිවස වෙත ගොස් ඒ අභියස වාඩි වී එසේ යාච්ඤා කිරීම නුවණට හුරු ක්‍රියාවක් නොවන්නට ඉඩ තිබිණි. ''යේසුස්වහන්සේගේ නාමයෙන් මේ නිවස අපගේය. අප වෙනත් කිසිම නිවසක් ගන්නට අදහස් කරන්නේ නැත. පියාණෙනි, අපට උවමනා කරන නිවස මෙයයි. ඔබවහන්සේ අපට එය ලබා දීමට යන බව අපි විශ්වාස කරනවා. මන්ද යේසුස්වහන්සේ පවසා තිබෙනවා අප උන්වහන්සේගේ නාමයෙන් ඉල්ලන කොයියම් හෝ දෙයක් අපට ලබා ගත හැකි බව..." කියා යාච්ඤා කළ යුතුව තිබිණි.

අප යාච්ඤාව තුළින් ඉල්ලන මොනයම් හෝ දෙයක් අපට ලබාගත හැකිය. නමුත් අප ඉල්ලන දේ උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත මිස එය අපේ කැමැත්ත නොවන බව අප විසින් දැනගත යුතුය.

අප උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද? යන්න අපට දැනගත හැක්කේ යාච්ඤාව සහ දේව වචනය කියවීම තුළිනි. අපේ ජීවිත සඳහා උන්වහන්සේගේ කැමැත්තට අනුව, අපි අපගේ ඇදහිල්ල භාවිතා කරන කල, අපට යුතු ලෙස ලැබිය යුතු දෙයට හිමිකම් කීමටත්, ප්‍රතිඵල සහිතව යේසුස්වහන්සේගේ නාමය නිසි පරිදි භාවිතා කිරීමටත් අපට හැකිය.

# 3

# නාමය භාවිතා කිරීම

**"ස්වාමීන්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන කවරේත් ගළවනු ලබන්නේ යයි දෙවියන්වහන්සේ කියන සේක යනුයි."**

ක්‍රියා 2:21

බයිබල් විද්‍යාලයේදී මගෙන් ඉගෙනුම ලැබූ, සභාවක දේවගැති ධූරය දැරීමට ගිය මගේ මිතුරෙක් අර්බුදකාරී අවස්ථාවක යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කිරීම පිළිබඳව කදිම උදාහරණයක් දැක්විය.

දිනක් වයස අවුරුදු 3ක් හෝ 4ක් පමණ වූ සිය පුතු සමග කාරයේ ගමන් ගනිමින් සිටි මොහු, වාහන බහුල සිව් මංසලක දකුණට හැරවීමට සූදනම් වෙමින් සිටියේය. දරුවා වාඩි වී සිටි පැත්තේ දොරේ අගුල දමා නොතිබුණ බව මොහු දැන සිටියේ නැත.

ඔහු දකුණට හැරවීමට පටන් ගනිත්ම ඔවුන් දෙදෙනාගේම බර කාරයේ එක් පැත්තකට යොමු විය. මෙය සිදුවූයේ 'ආසන පටි නීතිය' ක්‍රියාත්මක වීමට පෙරය. එබැවින් දරුවා ආසන පටිය පැළඳ සිටියේ නැත.

කාරය වේගයෙන් දකුණට හැරෙත්ම දරුවා සිටි පැත්තේ දොර වේගයෙන් අරුණි. දරුවා එළියට විසි වී හතර මං හන්දියේ හරි මැදට රෝල් වී ගියේය. වාහන පෙළ ඉදිරියට එමින් පැවතුණි.

හතර දිශාවෙන්ම වාහන පේළි ඉදිරියට එනවා දුටු බව පියාට මතකය. රථ රෝද පෙළක් වේගයෙන් ඉදිරියට එමින් ඔහුගේ පුතාව යට කරගෙන යාමට, ඔන්න! මෙන්න! කියා තිබුණි. ඔහුට කළ හැකිව තිබුණ එකම දේ නම් "යේසුස්" කියා කෑ ගැසීම පමණි.

ඔහු වහා රිය නතර කර ඉන් එළියට පැන, තම පුතු වෙත දුව ගියේය. දරුවාට කිසි හානියක් සිදු වී නොතිබිණි. තව ටිකකින් දරුවා රථයකට යට වීමට තිබුණි. පියා එම රිය පැදවූ මිනිසා දෙසට හැරී යළි යළිත් ඔහුට ස්තුති කළේය.ඒ සිය පුතු යට කරගෙන නොගොස් රිය පාලනය කර ගැනීම වෙනුවෙනි. එම රියදුරා කරකියාගත නොහැකිව මෙන් පසු විය. දරුවාගේ පියා ඔහුට ළංවී ඔහු සැනසීමට උත්සහ දැරීය.

"හිත කලබල කරගන්න එපා. මගේ පුතාට කිසි අනතුරක් නෑ. ඔබට රිය පාලනය කර ගැනීමට හැකිවීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න..."

"ඔබට තේරෙන්නේ නැහැ. ඔබට තේරෙන්නෙ නැහැ...." යැයි පුන පුනා කියද්දී ඔහු වෙව්ලමින් සිටියේය.

"මොකක්ද සිද්ධ වුණේ...?" පියා ඔහුගෙන් ඇසුවේය.

"මා අඩුම තරමින් බ්‍රේක් එකට පය තිබ්බෙවත් නැහැ..." මිනිසා පිළිතුරු දුනි.

එතුමාණන්ගේ නාමය තුළ වූ බලය රිය නතර කළේය. මෙය ඉතා ව්‍යාකූල අවස්ථාවක් විය. කිසිවක් කිරීමට, සිතීමට, සැලසුම් කිරීමට, හේතු සෙවීමට, කිසිවෙකුටත් කාලයක් නොවීය. රිය පැදවූ මිනිසාට

කරගත හැකි කිසිවක් නොවුවද 'යේසුස්' යන නාමය ජයග්‍රාහණය කළේය. හාස්කම් කිරීමේ බලය එතැන ක්‍රියාත්මක වීමෙන් දරුවාගේ ජීවිතය බේරුණේය.

## නාමය තුළ ඇති බලය සහ අධිකාරී බලය

"එකල උන්වහන්සේ දොළොස් දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුව කරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කරන්ටත් රෝගීන් සුව කරන්ටත් ඔවුන් යැවූ සේක..."

ශුඃලූක් 9:1,2

මගේ රැස්වීම් වලදී දේශනා කිරීමට අමතරව උපස්ථාන කාලයක් වෙන් කරනු ලැබේ. මිනිසුන් පෙළ ගස්වා එකිනෙකාට පෞද්ගලිකව යාච්ඤා කිරීමට මා යොදගෙන තිබිණ. මම එසේ කිරීමට ප්‍රිය කරමි. මගේ රැස්වීම් වාර ගණන එන්න එන්නම වැඩි විය. පෙර සඳහන් පරිදි එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්ට කාලය වැය කළේ නම් අන් කිසිවකට කාලය නොලැබී යනු ඇත.

නැගිට සිට යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරමින් මුළු සභාවට මාගේ ඇදහිල්ලෙන් බලය මුදා හැරීම මගින්ද එකිනෙකාට පුද්ගලිකව යාච්ඤා කිරීමේ දී මෙන්ම සුව කිරීමේ බලය අත් විඳිය හැකි බව මම දැන සිටියෙමි.

මහත් සිතේ බරකින් සහ සිත් තැවුලෙන් යුක්ත මිනිසුන් මගේ සභාවට පැමිණි විට එකී ආත්ම වලට එරෙහිව 'යේසුස්' යන නාමයෙන් අධිකාරී බලය මුද හැරිය කල එම පැමිණි අය එම බරින් සහ සිත් තැවුලෙන් නිදහස් වන බව මම දැන සිටියෙමි. එහිදී ඔවුන්ට නිදහස් හැඟීමෙන් යුක්තව සතුටින් පිට වී යා හැකි විය.

නමුත් ඔවුන්ගේ එම බැඳුම් විය ගස් බිඳ හෙලීමට සමත් වූයේ මගේ යාච්ඤාවට නොවෙයි. එය සිදු කළේ 'යේසුස්' යන නාමය තුළ වූ අධිකාරී බලයයි. මගේ යාච්ඤාව එකී බලය මුදා හැරීමේ මාධ්‍යය පමණක් විය.

## නෛතික බලය

**"...ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්ම කරන්න. මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක."**

**ශු: මතෙව් 28:18-20**

මේ පරිච්ඡේදයේ යේසුස්වහන්සේ මූලිකව පවසනුයේ, "**සැබවක් සැබවක් නුඹලාට කියමි- මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය; මා පියාණන්වහන්සේ ළඟට යන නිසා මීට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය**" යනුවෙනි. **(ශු:යොහන් 14:12)**

වෙනත් වචනයෙන් කිවහොත් අදහන්නාවූ සියල්ලන්ට යේසුස්වහන්සේ, එතුමාණන්ගේ නාමය භාවිතා කිරීමේ නීතිමය බලය දී ඇති බවයි. අපට කන්කෙඳිරි ගෑමට ඇඬීමට හෝ දුබලවීමට හේතුවක් නොමැත. තවද මේ සියල්ලෙන් පැන යෑමට හෝ අත් හැරීමට ද කිසිදු හේතුවක් ද නොමැත්තේය. අපි සියලු කල්හි ජයග්‍රාහණය නොලැබ පොර බදිමින් සිටින්නෙමු නම්, අප විසින් එම බලය භාවිතා කිරීම අත්හැර දමුවා සේ හැඟෙයි.

"අහෝ මාගේ ස්වාමිනී, මට හරි රස්නෙයි. මට හරි සීතලයි. දෙවියනේ මට මහන්සියි... මට බඩගිනියි... මා හරි දුර්වලයි...." ආදී වශයෙන් නිරර්ථක මෝඩ ප්‍රකාශණ කිරීමෙන් අප වැළකී සිටිය යුතුය.

එකී උත්කෘෂ්ඨ නාමය ආමන්ත්‍රණය කිරීමේදී අප එය ගෞරවයෙන් ද භක්තියෙන් ද යුක්තව එහි අන්තර්ගත බලය සහ අධිකාරීත්වය හඳුනා ගෙන හේතු සහිතව එය ආමන්ත්‍රණය කළ යුතුය.

අප යේසුස්වහන්සේගේ නාමය ආමන්ත්‍රණය කරන විට එතුමාණන්ගේ පූර්ණත්වය අප වට පිටාව මුළුල්ලෙහි ක්‍රියා කිරීමට ආරාධනා කරන බව අප දැන ගත යුතුය. එතුමාණන්ගේ නාමය එතුමණන්ව නියෝජනය කරන සේක. නාමය එතුමාණන්ගේ තැන ගනී. එතුමාණන්ගේ නාමය අමතන කළ එතුමාණන් එතැන වැඩ වාසය කරන සේක.

නෛතික බලය ලැබීම යනුවෙන් අදහස් කරන්නේ එයයි.

මගේ නැන්දගේ කටයුතු ඉටුකිරීම සඳහා නීතිමය බලය පැවරී ඇත්තේ මටයි. ඇගේ චෙක්පත් අත්සන් කිරීමට මට බලය ඇත. ඇගේ මුදල් වියදම් කිරීමටත් බිල් ගෙවීමටත් දේපොළ විකිණීමටත් බලය ඇත්තේද මටයි. මට එකී බලය සහ අධිකාරීත්වය ඇත්තේ ඇය විසින් නීතිමය ලියවිල්ලකින් මට ඒ බලය පවරා ඇති හෙයිනි.

යේසුස්වහන්සේ විසින් ඔබත් මාත් සඳහාද කර ඇත්තේද එබඳුම බලය පැවරීමකි. හේතු කාරණා, අධිපතිකම් සහ බලයන්ට විරුද්ධව කථා කිරීමේ බලය උන්වහන්සේ අපට දී ඇත. එසේ කර ඇත්තේ එතුමාණන් අප තුළ තැන්පත් කර ඇති නීතිමය බලය පැවරීමේ නියෝගය මතිනි. අප එම බලය පැවරීම ක්‍රියාත්මක කරනුයේ එතුමාණන්ගේ නාමය භාවිතා කිරීමෙනි.

## එතුමාණන්ගේ නාමය අවධානය ලබා ගනියි

**"මෙසේ දේව දූතයන්ට වඩා උත්කෘෂ්ඨ නාමයක් උන්වහන්සේට උරුමව තිබෙන ලෙසම ඔවුන්ට වඩා එපමණ උතුම් වූ සේක්"**

හෙබ්‍රෙව් 1:4

බයිබලයට අනුව යේසුස්වහන්සේගේ නාමය ආමන්ත්‍රණය කරන කල  මුළු මහත් ස්වර්ගයම ඒ කෙරෙහි අවධානය යොමු කරයි. අප යේසුස්වහන්සේගේ නාමය භක්ත්‍යාදරයෙන් හා විශ්වාසයෙන් යුතුව ආමන්ත්‍රණය කරන කල මුළු ස්වර්ගයම "ෂ්.... ෂ්.....ෂ්...ෂ්" කියමින් නිශ්ශබ්ද වන බව පැවසීම පුදුමයට කාරණාවක් නොවේ.

වැදගත් යමෙකු දන හැඳින ගැනීමට අපි කැමති ඇයි? ලොකු ලොකු මිනිස්සුන්ගේ නම් භාවිතා කර ඉන්  ප්‍රයෝජන ගැනීමට අපි කවුරුත් කැමතිය. එම පුද්ගලයාගේ නම භාවිතා කිරීමට අප කැමැත්තක් දක්වනුයේ ඉන් අපට ද යම් පමණක වටිනාකමක් එකතු වන බැවිනි.

එය සැබෑවක් බව මගේ දූ වරු දන සිටියහ. මගේ කාර්යාලයට මට එන සියලුම ඇමතුම් ලබා ගැනීමට මට බැරිය. එමෙන්ම මා ලවා කිසි වැඩක් කරවා ගන්නේ ද නැත. එම නිසා මිනිස්සු කාර්යාලයේදී මා ඇමතීමට උත්සාහ කරන කල ඔවුන්ට මගේ සහායකයින්ගෙන් කෙනෙකු අමතා හඬ පට පණිවිඩයක් තැබීමට සිදු වේ. මගේ කළමණාකරුවන් පිළිබඳව කාරණය ද එසේමය. ඔවුන් ඉතා කාර්ය බහුල බැවින් කෙලින්ම ඔවුන් ඇමතීමට අසීරුය.

සමහර අවස්ථාවල මා නිවසේ සිටින විට, "රොක්සේන් (මගේ සාමාන්‍යාධිකාරී) අමතන්න. මන්ද මට ඇයට කථා කිරීමට උවමනායි" කියා මගේ දියණියකට  පවසමි.

දන් මගේ දරුවන් තුළ ද වටිනාකමක් ඇත. මගේ සේවය තුළ

ඔවුන්ට ද ගරු සැළකිලි ඇත. නමුත් මගේ නමට තරම් දැඩි අවධානයක් ඔවුන්ට නොලැබෙන බව ඔවුන් දනිති.

එබැවින් මගේ දුව සැන්ඩ්‍රා කාර්යාලය අමතා "මේ කථා කරන්නේ සැන්ඩ්‍රා, මට රොක්සේන්ට කථා කරන්න පුළුවන්ද?" කියා පැවසූ විට සහ "මම මේ කථා කරන්නේ මගේ මව වෙනුවෙන්, මට රොක්සේන්ට කථා කරන්න පුළුවන්ද?" කියා පවසන විට තරම් ඉහළ ප්‍රතිචාරයක් නොලැබේ.

මා කාර්යාලය අමතන විට ඒ ඒ ඇමතුම් කෙලින්ම අදාළ අයට යොමු කරන ලෙස මම මගේ කාර්ය මණ්ඩලයට දැනුම් දී ඇත්තෙමි. මන්ද මා බැහැරව සිටින විට යළි ඇමතුම් දීමට හෝ බලා සිටීමට කාල වේලාවක් නොමැති බැවිනි.

එබැවින් තමන් මගේ නම භාවිතා කරන විට, තමන්ට වැඩි අවධානයක් සහ ඉක්මන් ප්‍රතිඵල ලැබෙන බව මගේ දූවරු දැන සිටිති.

ස්වාමින්වහන්සේගේ නාමය පිළිබඳව අප විසින් අනුගමනය කළ යුතු වන්නේ ද එකී ප්‍රතිපත්තියමය. අනිවාර්යෙන්ම අපි නාමය භාවිතා කරන්නන් වෙමු. එසේ භාවිතා කළ යුත්තේ නියම නාමයය. එය 'යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය' වන සේක. අප එම නාමය භාවිතා කරනුයේ, අවධානය ලබා ගැනීමට සහ අප ලබන ප්‍රතිඵල දෙවියන්වහන්සේ අපේක්ෂා කරන පරිදි සහ උන්වහන්සේගේ කැමැත්තට විය යුතුය.

## යාච්ඤාව තුළ නාමය භාවිතා කිරීම

**"සැබැවක් සැබවක් නුඹලාට කියමි - මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය; මා පියාණන්වහන්සේ ළඟට යන නිසා මීට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය. නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත්, පුත්‍රයා තුළ**

**පියාණන්වහන්සේ මහිමය ලබන පිණිස මම ඒක ඉෂ්ඨ කරන්නෙමි. නුඹලා විසින් මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත්, මම ඒක ඉෂ්ඨ කරන්නෙමි."**

**ශු: යොහන් 14:12-14**

මම සුපිරි ආත්මික බවක් මින් අදහස් නොකරමි. මා යාච්ඤා කරන කල යේසුස්වහන්සේගේ නාමය කිසියම් ආකාරයකට ආමන්ත්‍රණය කිරීමට මම කැමැත්තෙමි. ඒ විශේෂාකාර අවධාරණයක් කරමිනි. සමහර විට මගේ යාච්ඤා කාලයෙන් සියයට 75ක්ම වැය කෙරෙනුයේ ප්‍රශංසාවට සහ නමස්කාරයටය. ඉල්ලීම් ඉදිරිපත් කිරීමට වඩා ස්තුති දීම අගයෙන් වැඩි විය යුතුය.

අපට අවශ්‍ය කරන දේ දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටීම යහපත්ය. තවද එම ඉල්ලීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙනි. නමුත් අපි ප්‍රශංසා කරන්නන් වෙමු නම්, නමස්කාර කරන්නන් වෙමු නම්, අපි ස්තුතිවන්ත වෙමු නම්, කළගුණ දක්වන්නෝ වෙමු නම්, අපේ යාච්ඤා කාලයෙන් වැඩි කොටසක් ස්වාමින්වහන්සේට ප්‍රශංසා කිරීමටත්, නමස්කාර කිරීමටත්, කැප කිරීමටත් අපට පුළුවන. ඉන්පසු යේසුස්වහන්සේගේ නාමයෙන් අපගේ අවශ්‍යතාවය සඳහන් කළ හැකිය. එවිට උන්වහන්සේ අපේ අවශ්‍යතාව පිළිබඳව කටයුතු කිරීමට ඉතා ඉක්මණින් ක්‍රියාත්මක වන සේක.

බොහෝ අවස්ථාවල මට ඉතා වැදගත් යැයි හැඟෙන මගේ පෞද්ගලික යාච්ඤා කාලය තුළ මම දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට ඇතුල් වෙමි. එතුමාණන්ගේ නාමය නැවත නැවතත් ආමන්ත්‍රණය කරමි.

"යේසුස්වහන්ස, යේසුස්වහන්ස, යේසුස්වහන්ස, මම ඔබට ප්‍රේම කරමි. යේසුස්වහන්ස, මම ඔබේ නාමය විශාල කර දක්වමි. මම ඔබවහන්සේගේ ශුද්ධවූ නාමය ඔසවමි...." කියා යාච්ඤා කරමි.

මා එතුමාණන්ගේ නාමය ආමන්ත්‍රණය කරන විට  බලය නිකුත් වී වේදනා ලද්දවුන්, වහලුන් නිදහස ලබන බවත්, බන්ධන කැඩී යන බවත් මම දැන සිටිමි. මා එම නාමය ආමන්ත්‍රණය කරන විට රෝගීන් සුවය ලැබීමත්, යක්ෂාත්ම දුරුවීමත් මම අපේක්ෂා කරමි.

එකී බලය සහ ආධිපත්‍යය දෙනු ලබන්නේ මට පමණක් නොවේ. එතුමාණන්ගේ නාමය තුළ අන්තර්ගත බලය සියලුම ඇදහිලිවන්තයන්ට පොදුය.

ඇදහිලිවන්තයෙක් ලෙස ආලේපය ලත් ඔබේ අත යමෙකු මත තබා "යේසුස්වහන්සේගේ නාමයෙන් සුවය ලබන්නැයි" පවසන විට සිදුවන්නේ කුමක්දැයි ඔබ කිසිදක දැන නොසිටිනු ඇත.

යේසුස්වහන්සේගේ නාමය ගැන අප ගායනා කරන බොහෝ අවස්ථාවල ස්වාමින්වහන්සේ අපට දීමට උත්සාහ කරන පණිවිඩය කිමෙක්ද කියා අපි බොහෝ විට අවබෝධකර ගෙන නැත. විස්තරාත්මක (Amplified) බයිබලයේ  ශු:යොහන් 4:12-14 පදවල අපි එතුමාණන්ගේ නාමයෙන් යාච්ඤා කරන කල, අපව යේසුස්වහන්සේ පියාණන්වහන්සේට ඉදිරිපත් කරන බව යේසුස්වහන්සේ පවසන සේක.

මම ඊට ප්‍රිය කරමි. මන්ද එමගින් මා තුළ ඇති පීඩනය පහවෙයි. ''මා කෙබඳු අයෙක්ව සිටියේද? දැන් කෙබඳු අයෙක්ද, කෙබඳු අයෙක් වීමට අපේක්ෂා කරන්නේද?'' කියා මම ගෙන හැර නොදක්වමි. මන්ද මට වරදින බැවිනි. මා වැරදි කරන බැවිනි.

**යේසුස්වහන්සේගේ නාමයෙන් මම ඔබ අභිමුඛයට පැමිණෙමි. ඇදහිල්ලෙන් යුතුව මම මගේ ජීවිතය පුරා යේසුස්වහන්සේගේ ලේ ආලේප කර ගනිමි. මගේ සියලු පාප වලට කමා කරන මෙන් මම ඔබවහන්සේගෙන් අයදිමි. සියලු නාම වලට වඩා උසස් වූ එකී නාමය තුළින් ඔබවහන්සේ අභිමුඛයට පැමිණෙමි. මෙසේ කීමේදී**

**මම එතුමාණන්ගේ පුත් යේසුස්වහන්සේව මුළුමණින්ම පියාණන්වහන්සේට ඉදිරිපත් කරමි. හෙබ්‍රෙව් 9:26 සඳහන් පරිදි සියල්ලන් උදෙසා උන්වහන්සේ වරක් පැමිණ අප වෙනුවෙන් මැරී පාපයේ බලය සුන් කළ බව පැවසීමේදී, මා වෙනුවෙන් උන්වහන්සේ කුරුසිය මත කළ පූජා වීමද තුන්වෙනිද යළි මළවුන් කෙරෙන් නැගිටීමද සිහිපත් කරමි. මම යේසුස්වහන්සේ තුළ මගේ ඇදහිල්ල ප්‍රකාශ කරමි. ඒ මගේ පව් තවදුරටත් මතකයේ සටහන්ව නොපවතින පිණිසය.**

මා රැස්වීමක උපස්ථාන සේවයේ යෙදෙමින් සිටියදී බලවත් දේ ඉටුවෙනු දකීමට මම අපේක්ෂා කරමි. මම මගේ නම පැසසුමට ලක් කිරීමට හෝ මගේ කීර්ති නාමය ගොඩනගා ගැනීමට උත්සාහ නොකරමි.

මාගේ කාර්යය වන්නේ සැකයක් නැතිව 'යේසුස්' යන නාමයෙන් නැගී සිටීමයි. මිනිසුන් උදෙසා යාච්ඤා කිරීම, මාගේ කාර්යය වන අතර එහි ප්‍රතිඵලය දෙවියන්වහන්සේගෙන් බලාපොරොත්තු වෙමි. මට අවශ්‍යව ඇත්තේ උන්වහන්සේගේ නාමය මහිමයට පත් කිරීම සහ නාමය උසස් කිරීමත්ය. තවද උන්වහන්සේගේ නාමයේ බලයක් ඇති බව මිනිසුන්ට වටහා දීමත්ය.

## දවස පුරා යාච්ඤාවෙහි යෙදෙන්න පුරුදු වන්න

"පේතෘස්ද යොහන්ද යාච්ඤා වේලාව වූ නව වෙනි පැයේ දේව මාළිගාවට යද්දී, මවුකුස පටන් කොරව සිටි එක්තරා මනුෂ්‍යයෙක් ගෙන යනු ලැබුවේය. ඔහු මාළිගාවට ඇතුල්වෙන්නන් ගෙන් සිඟමන් ඉල්ලන පිණිස සුදර්ශන දොරටුව යයි කියන මාළිගාවේ දොරටුව ළඟ දවස්පතා තබන ලද්දේය. ඔහු පේතෘස්ද යොහන්ද දේව මාළිගාවට ඇතුල් වෙන්ට යනවා දැක, සිඟමන් ඉල්ලුවේය. පේතෘස් යොහන්

සමග ඔහු දෙස ඇස් හෙළා: අප දෙස බලන්නැයි කීවේය.ඔහු ඔවුන්ගෙන් යමක් ලබන බලාපොරොත්තුවෙන් ඔවුන් දෙස බලා සිටියේය. පේතෘස්ද: රන් රිදී මට නැත; නුමුත් මට ඇති දේ නුඹට දෙමි. **නාසරීය යේසුස්වහන්සේගේ නාමයෙන්, ඇවිදින්නැයි කියා, ඔහුගේ දකුණත අල්ලා ඔහු නැගිටෙවුවේය..."**

**ක්‍රියා 3:1-7**

මිනිසුන් විනිශ්චය කරනවා වෙනුවට, ඔවුන් ගැන 'යේසුස්' යන නාමයෙන් වැඩිපුර යාච්ඤා කරන්නේ නම්, ඔවුන්ගේ ජීවිත වලත්, අපගේ ජීවිත වලත් විශාල ඉදිරි පියවරක් ඇති වනු අපට දැකගත හැකිය. කෙසේ හෝ යාච්ඤා කිරීමට ගත වන්නේ විනිශ්චය සහ විවේචනය කිරීමට වඩා අඩු කාලයකි.

**මා ඔබට උදාහරණයක් දක්වන්නම්,**

තරුණයෙක් පාරේ ඇවිද යනු අප දකිනවා යැයි සිතමු. ඔහු වැනි වැනී ගමන් කරන බැවින්, එක්කෝ ඔහු මත්ද්‍රව්‍ය භාවිතා කර ඇත. නැතිනම් මත්පැන් පානය කර ඇතැයි අපි අනුමාන කරමු. ඔහු වැරහැලි හැඳ සිටින බැවින්, ඔහු උන්හිටි තැන් අහිමි අයෙක් යැයි ද අපි සිතමු.

මෙවැනි පුද්ගලයෙකු දෙස කී වාරයක් නම් බලා, "ඔය විදියට තමන්ගේ ජීවිතය විනාශ කර ගැනීම කෙනෙකුට මොන තරම් නින්දවක්ද?'' කියා අපි කොපමණ වාරයක් අන් අයට පවසා ඇත්තෙමුද? මොනතරම් භයානක ජීවත ක්‍රමයක්ද? මෙවැනි දුක්බර තත්වයකට මිනිසුන් පත් වන්නේ කෙසේද? කියා මට නම් හිතා ගන්නවත් බැහැ..." යැයි අපි කෙතරම් වාරයක් අපටම කියා ගනිමුද?

නමුත් "පියාණෙනි, අර තරුණයා එම විනාශකාරී තත්වයෙන් මුදන ලෙස මම 'යේසුස්' යන නාමයෙන් යාච්ඤා කරමි. දේව

සේවකයෙකු එනම්ඃ ඔහු ඇහුම්කන් දෙන යමෙකු ඔහුගේ මාර්ගට ඉදිරිපත් කරන්න. නිසි වේලාට ඔහුට වචනයක් කථා කරන්නට හැකි අයෙකු ඔහු වෙත ඉදිරිපත් කරන්න. ස්වාමිනි, මේ මොහොතේ පටන් ඔහු තවදුරටත් මුළාව නොවන පිණිස ඔබවහන්සේ ඔහුගේ ජීවිතය තුළ ක්‍රියා කරන්නට යන නිසා ඔබවහන්සේට ස්තුතියි." කියා පැවසීමට ගත වන්නේ සුළු කාලයක් සහ ශක්ති ප්‍රමාණයකි.

පේතෘස් සහ යොහන් කළාක් මෙන් දවස මුළුල්ලේ අපේ ගමන් මග පුරා යාච්ඤා කළ යුතුය. යාච්ඤා කිරීම යනු 'නිවසේ හෝ සභාවේ කිසියම් ශාරීරික ඉරියව්වකින් හිඳ කරන්නක් පමණක්ය' යන මානසික තත්වයෙන් අප අත් මිදිය යුතුය. දෙවියන්වහන්සේ ඉදිරියේ අපි වචනයෙහි චතුර විය යුතු යැයිද අපේ වචන විචිත්‍රවත් විය යුතු යැයිද එවිට දෙවියන්වහන්සේ අපගේ යාච්ඤාව අසනු ඇතැයි ද සිතීම අප විසින් යටපත් කර ගත යුතු මානසික තත්වයකි.

යාච්ඤාව යනු හුදෙක් දෙවියන් වහන්සේට කථා කිරීමකි. අපට එය දිනපතා දවස මුළුල්ලේ කළ හැකිය. පේතෘස් හා යොහන් කළාක් මෙන් එතුමාණන්ගේ නාමය කෙරෙහි ඇදහිල්ලෙන් යුක්තව අපද දවස මුළුල්ලේ යාච්ඤා කළ යුතුය. එතුමාණන්ගේ නාමයෙන් යාච්ඤා කිරීම (දෙවියන් වහන්සේගේ දූ පුතුන් ලෙස) අප උරුමයෙන් ලද අයිතිවාසිකම් වලින් කොටසකි.

## ලේ තුළ බලය ඇත

**"මක්නිසාද එළුවන්ගෙත් ගොනුන්ගෙත් ලේවලින්ද, අශුද්ධවී සිටින්නන්ට එළ නැම්බියෙකුගේ අළු ඉසීමෙන්ද මාංසය පවිත්‍රවන හැටියට පිරිසිදු කරනු ලබන්නේ නම්, කැලලක් නැතුව සදාකාල ආත්මයාණන් කරණ කොටගෙන තමන්ම දෙවියන්වහන්සේට පූජා වුණාවූ ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන්වහන්සේට සේවය කරන පිණිස,**

**මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘද සාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදු කරනු නොලබන්නේද?"**

**හෙබ්‍රෙව් 9:13,14**

යේසුස්වහන්සේගේ නාමය පිළිබඳවත් එතුමාණන්ගේ ලේ පිළිබඳවත් කථා කිරීමටත් ගායනා කිරීමටත් මම ප්‍රිය කරමි. මන්දයත් එසේ කරද්දී අපි අවංක නම් යක්ෂාත්ම පලා යන්නේය.

ඔබට යම් හාස්කමක් වීමට අවශ්‍ය නම් යේසුස්වහන්සේගේ නාමය සහ එතුමාණන්ගේ ලේ පිළිබඳව යාච්ඤා කිරීමටත්, ගායනා කිරීමටත්, වර්ණනා කිරීමටත් පටන් ගන්න. ලේ තුල බලය ඇත. ජීවිත කාලය පුරාම කරන ලද පාප සෝදා හැරීමට තරම් සෑහෙන බලයක් ඒ තුළ ඇත.

ඔබත් මාත් සතුව ඇති දේ පිළිබඳව සිතා බලන්න. යේසුස්වහන්සේගේ නාමයත් එතුමාණන්ගේ ලේත් අප සතුව ඇත. ඒ ලේ වලින් අපි කිසි දිනෙක පව් නොකළාක් මෙන් අප මුළුමනින්ම පවිත්‍ර කරයි. (1 යොහන් 1:7) පොළොවෙහිද ස්වර්ගයෙහිද මුළු බලය, 'යේසුස්' යන නාමය තුළ තැන්පත්ව ඇත. ඒ නාමයේ බලය අපට ද ලැබී ඇත.

දැන් අපි ඒ ලේ වලින් පිරිසිදු වී, සේදී සිටිමු. අප කුමක් ඉල්ලුවද? කුමකට ආමන්ත්‍රණය කළද? උන්වහන්සේව මුළුමණින්ම ඉදිරිපත් කරමින්, උන්වහන්සේගේ නාමය අප ආමන්ත්‍රණය කරන බැවින් අපට එය ඉටු කිරීමටත්, සැපයීමටත් යේසුස්වහන්සේ පොරොන්දු වී සිටින සේක. මක්නිසාද අප කථා කරන්නේ සියලු බලය ඇති උන්වහන්සේගේ නාමයෙනි.

බලයෙන් තොර ජීවිතයක් ගත කරන්න එපා. ඔබට ලබා දී ඇත්තා වූ දෙවියන්වහන්සේගේ බලය, ප්‍රශංසාව සහ යාච්ඤාව තුළ නිෂ්ඵල නොවන ලෙස ලබා ගැනීමට ඉගෙන ගන්න.

# 4

# නාමය නිකරුණේ භාවිතා කිරීම

"නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ නාමය නිකරුණේ ව්‍යවහාර නොකරව; මක්නිසාද ස්වාමීන්වහන්සේ තමන් නාමය නිකරුණේ ව්‍යවහාර කරන තැනැත්තා නිවැරදිකාරයෙකු කොට ගණන් නොගන්නා සේක."

**නික්මයාම 20:7**

ශුද්ධ බයිබලයේ මේ පදය ගැන මෙසේ සඳහන් වේ. නුඹේ දෙවියන් වහන්සේ වන ස්වාමින්ගේ නාමය නිකරුණේ භාවිත කිරීම හෝ පුන පුනා ආමන්ත්‍රණය කිරීම නුඹ නොකළ යුතුය. (එනම් හැල්ලුවට ගණන් ගැනීම, තේරුමක් නොමැති දෙයට භාවිතා කිරීම, වැරදි වැටහීම්, ගරුසරු නැති අසභ්‍ය දේට භාවිතා කිරීම ආදියයි.)

වසර කීපයකට ඉහත මෙකී, ස්වාමින්වහන්සේගේ නාමය නිකරුණේ භාවිතා කිරීම පිළිබඳව මට එළිදරව්වක් ලැබිණි.

එතෙක් මා සිතා සිටියේ ස්වාමින්වහන්සේගේ නාමය නිකරුණේ භාවිතා කිරීම යනු ශාපයකට එය යාකර ගැනීම හෝ වෙනත් ආකාරයක නිගරු දේකට එය භාවිතා කිරීම කියාය.

නමුත් එතුමාණන්ගේ නාමය හැල්ලුවට හෝ තේරුමක් නොමැති දෙයකට ලෙස භාවිතා කිරීම පිළිබඳව කියැවෙන ඉහත බයිබල් පදය කියවීමෙන් අනතුරුව නොඇදහිලිවන්තයින් පමණක් නොව, ඇදහිලිවන්තයින් පවා එතුමාණන්ගේ නාමය කොපමණ වරක් නිකරුණේ භාවිත කරන්නේ ද යන්න ස්වාමින්වහන්සේ මට පෙන්වන්නට පටන් ගත් සේක.

"දෙවියන් වහන්සේ" යන වචනය අපි නොයෙක් අයුරින් භාවිත කරන්නෙමු. බොහෝ විට අපි යාච්ඤා කිරීමේ දී වෙනත් මනඃකල්පිත මිනිසෙකුගේ නාමයට වඩා වෙනසක් එතුමාණන්ගේ නාමයට නොදෙන්නෙමු. අපි කිසි ගරු බියක් නොමැතිව ඕනෑවට එපාවට එතුමාණන්ගේ නාමය ප්‍රයෝජනයක් නොමැති ලෙස ඔහේ භාවිතා කරන්නෙමු.

## ධන සහ ඍණ පටලවා ගැනීම

**"උල්පත එක සිදුරෙන් මිහිරි දියත් තික්ත දියත් නිකුත් කරයිද?"**

යාකොබ් 3:11

ස්වාමින්වහන්සේගේ නාමය සතු වූ බලය මුදාහරිනු අත්දැකිය නොහැකි වීමට එක් හේතුවක් වනුයේ, 'අපේ ආමන්ත්‍රණයේ දී අපගේ විශ්වාසයේ ස්ථිරත්වය සහ අස්ථිරත්වය නොතේරුම් ගැනීම' යනු මාගේ විශ්වාසයයි. එසේ වීමේදී අපගේ බලාපොරොත්තුව බින්දුවට බසිනු ලැබේ.

අපට විශාල ඉදිරි පියවරක් අවශ්‍ය වූ විටෙක ස්වාමින්ගේ නාමය ධනාත්මකව භාවිතා කිරීමට නොහැකි විටෙක දකුණට හැරී එය ඍණාත්මකව භාවිතා කර ඒ තුළද එම බලයම බලාපොරොත්තු වෙමු.

ස්වාමින්වහන්සේ මේ තත්වය පිළිබඳව මට කථා කළ සේක. (ඒ කණින් ඇසිය හැකි හඬකින් නොව මගේ ආත්මයටය.) "සමහර මිනිසුන්ට කිසිම ස්ථිරත්වයක් නොමැත. මන්දයත් ඔවුන් දවසක ධනවාදී අය වෙති. ඊ ළඟ දවසේ ඍණවාදීන් වෙති" යැයි එතුමාණෝ පැවසූහ.

අපි අවංක පසුතැවිලි වීමකින් සහ වචනයට එකඟව යාච්ඤා කරන කල දේව දූතයෝ අපි වෙනුවෙන් ක්‍රියා කිරීමට ඉක්මන් වෙති. (ගීතාවලිය 103:20, හෙබ්‍රෙව් 1:14 බලන්න) නමුත් අපි විඩාවට පත්ව, සිතින් ක්ලාන්ත වීමට පටන් ගන්නා කල, සියලු ආකාර අසුභවාදී දේ පවසන්නට පටන් ගත් කල අප යාච්ඤා කරමින් සිටි අරමුණ, එමගින් කණපිට පෙරළෙනු ලැබේ. අවසානයේ අපි පටන් ගත් තැනටම නැවත පැමිණෙන්නෙමු.

"අනේ දෙවියනේ මට හරි මහන්සියි..." ආදී වචන කියන කල එය යාච්ඤාවක් නොවෙයි. එසේ කීම දෙවියන්වහන්සේ ඇමතීමක් ද නොවෙයි. ඒ තම හැඟීම් ප්‍රකාශ කරන වැකියක් පමණි.

එවැනි තත්වයකට පත්ව සිටියදී, ජ්වලිතව යාච්ඤාව තුළින්, අපේ සිත ස්වාමින්වහන්සේ වෙත ඔසවමින් "අනේ දෙවියනේ මට හරි වෙහෙසයි" යැයි පැවසීම යහපත්ය. නමුත් බොහෝ අවස්ථාවල අප කරනුයේ එය නොවෙයි. ඒ පිළිබඳව කල්පනා නොකර අප කරනුයේ ස්වාමින්වහන්සේගේ නාමය සැහැල්ලුවට තේරුමක් නොමැතිව භාවිතා කිරීමයි. එසේ කරන කිසිවෙකු නිවැරදි කොට ගණන් නොගන්නා බව දෙවියන්වහන්සේ තමන් වචනය තුළින් පැහැදිලි කොට ඇත. එතුමාණන්ගේ නාමය භාවිතා කිරීමේදී අප ප්‍රවේසම් විය යුත්තේ එබැවිනි.

තමන් දෙවියන්වහන්සේව අමතන අවස්ථාවල නොවුවද "අහෝ! දෙවියෙනි, අනේ! දෙවියෙනි, යනුවෙන් මිනිස්සු ද ඇදහිලිවන්තයින්ද පවා පුරුද්දකට මෙන් ස්වාමින්වහන්සේගේ

නාමය පවසනු මා යන සැම තැන්හිම මට අසන්නට ලැබේ. මෙවැනි ප්‍රකාශණ කිරීමේ පුරුද්දක් ද ඔවුනට ඇත.

"දෙවියනේ මේ දවස්වල සිල්ලර බඩු වර්ග හරි ගණන්"

"දෙවියනේ, මෙතැන හරි රස්නෙයි.."

"අනේ දෙවියනේ, මට සීතලයි..."

"අනේ දෙවියනේ, මට හරි බඩගිනියි. මට හිතෙන්නේ මං මැරෙන්නයි යන්නේ..."

දේශපාලඥයන්, මැදිහත්කාරකම් කරන්නන්, නමස්කාරය මෙහෙය වන නායකයින් හෝ මිෂනාරීවරුන් අතර සිටියදී පවා මට මෙවැනි වචන කියන බව අසන්නට ලැබේ. මට එවැනි දේ මොනතරම් අසන්නට ලැබේද යත් ඔවුන් එසේ කරන සැම අවස්ථාවකම ඔවුන්ව නිවැරදි කරන්නට යෑම තේරුමක් නැතැයි මට සිතෙයි.

නමුත් එසේ කිරීමෙන් ඔවුන් තමන්ටම මහත් අලාභ සිදුකර ගන්නා බව මා දන්නා බැවින් එය මට මහත් කණගාටුවක් උපදවයි.

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ බොහෝ දෙනා මේ කාරණා පිළිබඳව මහත්සේ වෙනස් විය යුතු බව ස්වාමින්වහන්සේ මට පෙන්වා දී තිබෙන සේක. නාමය කෙරෙහි අප මීට වඩා ගරු කළ යුතුයි.

## නාමය කෙරෙහි ජ්වලිත වීම

**"එහෙයින් සොලවන්ට බැරි රාජ්‍යයක් ලබන්නා වූ අපි, ගෞරවයෙන්ද දේව භයින්ද දෙවියන්වහන්සේට ප්‍රසන්න වන ලෙස සේවය කරන පිණිස අනුග්‍රහය ඇතුව සිටිමු."**

**හෙබ්‍රෙව් 12:28**

දෙවියන්වහන්සේගේ නාමය තේරුමක් නොමැතිව භාවිතා කෙරෙන රූපවාහිනී වැඩසටහන් මා බලන්නේ නැත. වැඩසටහන කුමක් පිළිබඳව වුවද, මගේ පවුලේ උදවියට සහ මට එය නැරඹීමට කොපමණ උවමනා වුවද, ඒ තුළ දෙවියන්වහන්සේගේ නාමය තේරුමක් නොමැතිව භාවිතා වන්නේ නම් එය වසා දමනු ලබයි.

ඇයි?

මන්ද ජ්වලිතය යනු එයයි. එතුමාණන්ගේ නාමය යමෙකු තේරුමක් නොමැතිව භාවිතා කරමින් වින්දනය ලබනු දැකීම මා හට දරා ගත නොහැකි තරම් මම ස්වාමින්වහන්සේට ප්‍රේම කරමි. එසේ වීමට තරම් ස්වාමින්වහන්සේ මට කර ඇති දේ බොහෝය.

අපට එය අවශ්‍ය කරන විට ස්වාමින්වහන්සේගේ බලය අප ජීවිත තුළට මුදා හැරීම අප බලාපොරොත්තු වන විට මෙන්ම, එසේ නොවන අනෙකුත් අවස්ථාවලදී පවා අපි එකී නාමය කෙරෙහි ගෞරවය දැක්විය යුතු බව මම තරයේම විශ්වාස කරමි.

පරණ ගිවිසුම යටතේ මිනිසුන්, ස්වාමින්ගේ නාමයට කොතරම් ගරුබිය දැක්වූයේ දැයි යන්න පිළිබඳව අද බොහෝ දෙනාට අවබෝධයක් නැත. ඔවුන් ඊට කෙතරම් බියක් දැක්වීද යත් ඔවුන් එය ආමන්ත්‍රණය කළේවත් නැත. බොහෝ විට ඔවුන් සඳහන් කළේ "ඒ නාමය" යනුවෙනි. මන්ද ඒ නාමය තුළ අන්තර්ගත බලය පිළිබඳව ඔවුන් දැන සිටි බැවිනි.

"ස්වකීය දෙවිවරුන්ගේ නාමයෙන් දාවිත්ට ශාප කළ, ඔහුගේ මාංශය ආකාශයේ පක්ෂීන්ටද වනයේ මෘගයින්ටද දෙන්නෙමියි දාවිත්ට තර්ජනය කළ පිලිස්තීන ජාතික රණශූර යෝධයා වන ගොලායත්, දාවිත් වෙතට පැමිණෙද්දී දාවිත් පැරණි ගිවිසුම තුළ වාසය කළේය." (1 සාමුවෙල් 17:43,44)

දවිත් අර්බුදකාරී තත්වයක් යටතේ පසුවිය. නමුත් ඔහු සතුරාගේ තර්ජන වලට පිළිතුරු දුන්නේ, "...තෝ කඩුවක්ද හෙල්ලයක්ද කුඩා හෙල්ලයක්ද රැගෙන මා ළඟට එන්නෙහිය. මම වනාහී තා නින්ද කළ ඉශ්‍රායෙල් සමුද්‍රවල දෙවිවූ සේනාවල ස්වාමීන්වහන්සේගේ නාමයෙන් තා ළඟට එමි" පවසමිනි. (45 පදය)

"මම අද දවසේ තාගේ හිස කපා දමමි" යයි දවිත් පැවසීය.

බොහෝ සෙයින් සන්නද්ධව සිටි යෝධයාට විරුද්ධව සටනට යාමේදී දවිත් රැගෙන ගියේ කැටපෝලයක් සහ ස්වාමින්වහන්සේගේ නාමයත් පමණි. නමුත් මේ පිත්තල මෙන් තද මනා සේ සන්නද්ධ යෝධයා පරාජය කිරීමට එය හොඳටම ප්‍රමාණවත් විය.

අපේ ආත්මික සතුරා වන යක්ෂයාගේ විරුද්ධකම් වලට මුහුණ දීමේදී ඔබත් මාත් කළ යුත්තේද එයයි. ස්වාමින්වහන්සේ අපට සපයා දී ඇති ආත්මික ආයුධ අපට අවශ්‍යය. එසේම අප දැන් දන්නා පිරිදි එතුමාණන්ගේ නාමය ඒ ආයුධවලින් එකකි. යේසුස්වහන්සේගේ නාමය අඳුර විනිවිද යන සේක.

## ගැටළුව පිටුපස ඇති අශුද්ධ ආත්මය පිළිබඳව කටයුතු කරන්න

**"මක්නිසාද අපේ පොර බැදීම වනාහී මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධය."**

**එපීස 6:12**

යමෙක් අපව බැරෑරුම් තත්වයකට ඇදහෙලන්නේ නම් හෝ බලාපොරොත්තු නොමැති තත්වයකට පත්කරන්නේ නම් ඒ

පුද්ගලයා විවේචනයට පත් කිරීමෙන් සිදුවන යහපතක් නොමැත. ඒ පුද්ගලයා පිටුපස ක්‍රියා කරන අශුද්ධ ආත්මයට 'යේසුස්' යන නාමයෙන් අප අණ කළ යුතුය.

මා අවට සිටින මිනිස්සු මට නිරන්තරයෙන්ම ශාප කරන අවස්ථා ද ඇත. එවැනි අවස්ථාවල ඒ අය වෙතින් ඉවත්ව, "යේසුස්වහන්සේගේ නාමයෙන් මම නුඹලාට අණ කරමි. අදම ශාප කිරීමේ ආත්මය නුඹ කට වසා ගන්න. දවස මුළුල්ලේ ඊට සවන් දීමට මා සූදනම් නැහැ..." යනුවෙන් පවසමි.

තවත් විටෙක මිනිසුන් මා විවේචනය කරමින් ද, මුමුණමින් ද, කොඳුරමින් ද, වැරදි සොයමින් ද සිටිනු මට අසන්නට ලැබේ. ඒ අය සමග මුළු දවසම ගත කිරීමට මට සිදුවෙන අවස්ථාද ඇත. නැවතත් මම ඉවත්ව ගොස් "පියාණෙනි, යේසුස්වහන්සේගේ නාමයෙන් ඒ විවේචනයේ ආත්මය බැඳ දමමි. දවස පුරාම මෙබඳු දේට සවන් දීමට මා සූදනම් නැතැ"යි පවසමි. (ශුඃමතෙව් 18:18 බලන්න)

"ඔබට නිතරම ක්ෂණික ප්‍රතිඵල ලැබෙනවාද" කියා සමහර අවස්ථාවල මිනිස්සු මගෙන් විමසති.

පිළිතුර නැත යන්නයි. මිනිසුන්ට නිදහස් කැමැත්තක් ඇත. මගේ යාච්ඤා හා ප්‍රතිපත්ති ප්‍රකාශන සඳහා මැදිහත් වී එය අක්‍රීය කිරීමට ඔවුනට පුළුවන. නමුත් වෙනත් මොනයම් හෝ ක්‍රියා මාර්ගයක් ගැනීමට පෙර පළමු කොට ඒ පිළිබඳව මම යාච්ඤා කරමි.

යාච්ඤාව යනු ගැටළු නිරාකරණය කර ගැනීමට ඇති බලවත් සැබෑ වූ මාර්ගයයි. මවිසින් පුද්ගලයාට කෙළින්ම යමක් පැවසීමට ඇත්නම් මම එසේ කරමි. නමුත් මේ වැනි අවස්ථා වලදී මා නිතරම ශුද්ධාත්ම මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

වැදගත් කාරණය නම් අප විසින් එදිනෙදා මුහුණ පාන අවස්ථා සහ පුද්ගලයින් පිළිබඳව අප මීට වඩා යාච්ඤාවෙන් යුක්ත වීමය.

එසේම යේසුස්වහන්සේගේ නාමය තුළ බලය ඇති බව අප මෙනෙහි කළ යුතුය.

## නාමය විහිළුවක් නොවේ.

"කැතකම්ද මෝඩ කථාද නීච කවටකම්ද යන මේවාත් නුසුදුසුය..."

**එපීස 5:4**

දෙවියන්වහන්සේ මා තදින් හික්මවූ මා පුරුද්දක් කොටගෙන තිබුණ තවත් කාරණයක් වූ එතුමාණන්ගේ නාමය අලලා මෝඩ, අඥනව කථා කීමයි.

උදාහරණයක් ලෙස, එක්තරා රාත්‍රියක හරියටම රාත්‍රි ආහාර ගන්නා වෙලේ මගේ පුතා නිවසට පැමිණියේය. ඒ වන විට අපූරු කෑම වේලක් මේසය මත පිළියෙළ වී තිබිණ. තවද ඔහු නොයෙක් දේ ගැන දිගින් දිගටම කථා කරමින් සිටියේය. ඒ කථා බහට සහභාගි වූ මට කොහෙත්ම ඔහුට පිටවී යාමට හදිසියක් නැති බව පෙනී ගිය කල "යේසුස්වහන්සේගේ නාමයෙන් පිටවී යන්න" කියා මම විහිළුවට මෙන් පැවසුවෙමි.

මා එසේ කී මොහොතේම මහත් වරදකාරී හැඟීමක් මට දැනුණි. මන්දයත් දෙවියන්වහන්සේ ඒ අවස්ථාව එම මොහොතේදීම මට අවබෝධ කළ සේක.

එවැනි බොහෝ දේ විහිළුවට මෙන් මිනිසුන් විසින් පවසනු මම බොහෝ විට අසා ඇත්තෙමි. නමුත් නාමය අලලා විහිළු කථා නොකීමට අප වග බලා ගත යුතුය.

වරක් මම නිත්‍ය පදනමක් මත වචනය බෙදා ගන්නා බලවත් කිතුණු මැදිහත්කාරියක සමග දහවල් ආහාරයට සහභාගි වීම පිණිස

ගියෙමි. පැයක් ඇතුළත පස්වතාවක් ඇය නිකරුණේ මෝඩ ලෙස ස්වාමින්වහන්සේගේ නාමය  භාවිතා කරනු මට අසන්නට ලැබිණ. බොහෝ අවස්ථාවල ඇදහිලිවන්තයින් පවා තමන් කරන දේ පිළිබඳව හරිහැටි අවබෝධයකන් නොමැතිව එසේ කරයි.

ඔබ ස්වාමින්වහන්සේගේ නාමය භාවිතා කරන කුමන හෝ අවස්ථාවක හෝ ඔබ අවංකව එසේ කරන බවට සහතික වන්න. වැරදි පුරුදු නිසා ඔබ අතින් වරදක් සිදුවී නම්, ඔබේ කට වැරදීමකින් එතුමාණන්ගේ නාමය නුසුදුසු ලෙස භාවිතා වූයේ නම් වහාම එය නවත්වා පසුතැවිලි වන්න. එතුමාණන්ගේ නාමය නිකරුනේ භාවිතා කිරීම පිළිබඳව එතුමාණන්ගෙන් සමාව අයදින්න. නමුත් ස්වාමින්ගේ නාමය නුසුදුසු ලෙස භාවිතා කිරීමෙන් ඔබ ඔබටම හානි පමුණුවා ගන්නා බව සිහි තබා ගන්න. ඔබට අවශ්‍ය විටෙක නාමයේ බලය මුදාහරිනු ලැබීම ඔබ අපේක්ෂා කරන්නේ නම් සෙසු කාලය තුළද ඔබ එතුමාණන්ගේ නාමයට ගරුබිය දැක්විය යුතුය.

අදහන්නාවූ අපට නාමය ආමන්ත්‍රණය කරන මොහොතේම බලය දෙවා වදරණු ලැබේ. එනම්, යක්ෂයාට සහ ඔහුගේ දුෂ්ට සේනාවන්ට විරුද්ධ වීමේ බලය, අපට උපකාර ලබාගැනීමේ බලය සහ අන්‍යයන්ට උපකාර ලබාදීමේ බලය ආදී වශයෙනි. නමුත් මා අදහස් කරන්නේ බලය වැගිරෙන්නට සැලැස්වීමක් නොවෙයි. අප ලුහුබැඳ, අප පසුකර ගොස්, අපව වසා ගන්නා දෙවියන්වහන්සේගේ ආශීර්වාද උතුරා යාමකි.

ඒ බලය ලබා ගැනීමට ඇති ප්‍රධාන යතුර නම්: එකී උත්කෘෂ්ඨ නාමය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය ගරු කිරීමෙන්ද, භක්තිමත් ලෙස ද කථා කිරීමය.

# 5

# නාමයට ඇති ගෞරවය සහ භක්තිය

"...මක්නිසාද මම මහත් රජෙක්ය, මාගේ නාමය ජාතීන් අතරෙහි භයානකව තිබේ යයි සේනාවල ස්වාමීන්වහන්සේ කියන සේක.."

මලාකි 1:14

ඔබ මෙම පොතේ මේ ස්ථානයට පැමිණි කල, යේසුස්වහන්සේගේ නාමය අන් කවර හෝ සාමාන්‍ය නාමයකට වඩා වැඩි යමක් ඇති බව ඔබ අවබෝධ කරගෙන ඇතැයි මම බලාපොරොත්තු වෙමි. ඒ නාමය තුල බලය ඇත. එතුමාණන්ගේ නාමයට ගෞරව සම්ප්‍රයුක්ත භක්තියක් දක්විය යුතු යයි ඉහත දක්වෙන පදයෙන් ස්වාමින්වහන්සේම අපට අනතුරු අඟවන සේක.

භක්තිය (බිය) යනුවෙන් මෙහි සඳහන් කරනුයේ එතුමාණන්ට ඇති ගෞරවාන්විත විශ්වාසය, ප්‍රේමය සහ කීකරුකමයි. හිතෝපදේශ 1:7 පදයේ මෙසේ පවසයි. "ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීම දැන ගැන්මේ පටන් ගැනීමය. අඥනයෝ ප්‍රඥාවද ගුරුකමද හෙළා දකිති."

ඔබට සත්‍ය දැනගැනීමට අවශ්‍ය නම්ඃ මෙන්න, අද දවසේ බොහෝ ක්‍රිස්තියානින් බොහෝ ආත්මික දේට ඇති ගරු බිය නැතිව සිටිති.

දෙවියන්වහන්සේ අපගේ මිත්‍රයා යයි අප දැන ගත් කල, අපි එතුමාණන් සමග වඩාත් සුවදායක සම්බන්ධතාවයකට එළඹෙමු. උන්වහන්සේ කෙතරම් උතුම්ද, බලවත්ද යන්න අවබෝධ කොට නොගෙන, උන්වහන්සේව "අඹ යාළුවෙකු" සේ සැළකීමට යාමේ දී අපි වඩාත් ප්‍රවේශම් විය යුතු බව, ටික කලකට පෙර උන්වහන්සේ මගේ සිතට කථා කළ සේක.

## භක්තිය කීකරුකම උපදවයි

**"දරුවෙනි, නුඹලාගේ දෙමාවුපියන්ට ස්වාමීන්වහන්සේ තුළ කීකරු වෙන්න. මක්නිසාද එසේ කරන්ට යුතුය. නුඹට වැඩ සිද්ධ වන පිණිසද නුඹ පොළොවෙහි බොහෝ කල් ජීවත්වන පිණිසද, නුඹේ පියාටත් මවුටත් ගෞරව කරන්න.** (උසස්කොට සිතන්න. වටින සේ සළකා අගය කරන්න.) **එය පොරොන්දුවක් ඇති පළමුවෙනි ආඥාවය."**

**එපීස 6:1-3**

අපි බොහෝ සේ ගරු කරන්නෙමු නම් අපි බොහෝ සේ කීකරුකම දක්වන්නෙමු. මන්ද ගෞරවය, කීකරුකම අවදි කරවයි.

දරුවන් තුළ දෙමාපියන් කෙරෙහි ගෞරවාදරය ඇත්නම්, ඔවුන් දෙමාපියන් සමග තර්ක කරන්නේවත් ඔවුන් සමග කැරළි ගසන්නේවත් නැත.

බොහෝ දරුවන් සිය දෙමාපියන්ට ගරුබිය නොදක්වන්නේ, මව්පියන් ලෙස ඔවුන් ආත්මික දේ පිළිබඳව තමන් තුළ තිබිය යුතු ගරුබිය නැති කරගෙන සිටින නිසායයි මම විශ්වාස කරමි.

ආත්මික නායකයන් කෙරෙහිද පොදුවේ ගත් කල අධිකාරීත්වය දරන්නන් කෙරෙහිද ඔවුන් තුළ ගරුබිය නොමැති කම නිසාය. ප්‍රතිඵලයක් වශයෙන් ගරු බිය හීනකම දෙමාපියන්ගෙන් සිය දරුවනට දයාද කෙරෙයි. එවිට දරුවෝ පෙරළා උත්තර බැඳීමද, තර්ක කිරීම, කැරළි ගැසීම ආදියට පෙළඹෙති. මව්පියන් සිය හාම්පුතුන්ට ප්‍රසිද්ධියේ අගෞරවය දක්වන්නේ නම් ඔවුන් එමගින් සිය දරුවන්ටද අගෞරව දක්වීම නැමැති නරක ආදර්ශය ලබා දෙති.

දෙහැවිරිදි දරුවෙකු සුපිරි වෙළඳ සැලක් වැනි ප්‍රසිද්ධ ස්ථානයකදී, කෝපයෙන් යුතුව ආවේගශීලිව සිය මවට පහර දීම, පයින් ගැසීම වැනි දේවල් අද සුලභ සිදුවීම්ය. අප ප්‍රවේශම් නොවුහොත් දවසක අපේ දරුවන්ද අප පිළිබඳවද සළකනු ඇත්තේ ඒ ආකාරයෙන්මය. වෙනත් වචනයෙන් කිවහොත් ඔවුන් පළමුව අපටත් දෙවනුව ස්වාමින්වහන්සේටත් අනෙකුත් පාලකයන්ටත් ගරු නොකරන තැනට පත්වෙති.

සාතන් කිරීමට උත්සාහ දරන්නේ මෙය බව අප විසින් තේරුම් ගත යුතුය. ඔහු ගරුබිය නැතිකම සහාව තුළටද රිංගා ගන්නා පිණිස ලෝකය පුරා ගරුබිය නැතිකම වපුරයි. මන්ද එසේ වූ කල අපි අකීකරු කමට පාත්‍රවන බව ඌ දනියි. අකීකරුකම අපේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ බලය අහිමි කරවීමට මං සළසයි.

එසේ වීම වළක්වා ගනු පිණිස අප විසින් රැකගත යුතු කාරණයක් නම් සමීපතම ඇසුරයි.

## සමීපතම ඇසුර ගරුබිය හීන කරවයි

**"ඔවුන් නාබොත්ගේ පාවරට පැමිණි විට හරක් දැගලූ බැවින්, උස්සා දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටියට අත දිගුකොට එය ඇල්ලුවේය. එවිට ස්වාමින්වහන්සේගේ උදහස**

**උස්සාට විරුද්ධව ඇවුළුණේය; ඒ වරද නිසා දෙවියන්වහන්සේ එහිදී ඔහුට පහර දුන්සේක; ඔහු දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ළඟ මළේය.”**

2 සාමුවෙල් 6:6,7

දාවිත් සහ ඔහුගේ සෙනඟ ගිවිසුම් පෙට්ටිය පෙරළා බෙත්ලෙහෙම වෙත ගෙන එමින් සිටි බව පරණ ගිවිසුමේ මේ ඡේදයෙන් අපට දැකගත හැකිය. ඔවුන් එක්තරා ස්ථානයකට ළඟාවත්ම, රථය ඇදගෙන එමින් සිටි ගොනුන් දඟලන්නට පටන් ගත් බැවින් ගිවිසුම ඇතුළත් පෙට්ටිය සෙලවෙන්නට විය. කරත්තය දක්වමින් සිටි උස්සා නම් තරුණයා ගිවිසුම් පෙට්ටිය කෙලින් සිටවන පිණිස ඒ දෙසට ළං විය. එබැවින් දෙවියන්වහන්සේ ඔහුගේ ගරුබිය නොමැතිකම ගැන ඔහුට පහර දුන්නේය. ඔහු එතැනම මළේය. (7වැනි පදය)

ගිවිසුම් පෙට්ටිය ස්පර්ශ කළ යුත්තේ කවුරුන් විසින්ද එය ගෙන යෑම කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳව ස්වාමීන්වහන්සේ මෝසෙස්ට විශේෂ උපදෙස් දී තිබුණ බව ගණන් කථාව 3-4 යන පරිච්ඡේද වල අපට කියවන්නට ලැබේ. උස්සා මරණයට පත් වූ බැවින් දාවිත් ශෝකයටත් වරදට පත් කරනු ලැබීමටත් පත් වූ බව 8 වැනි පදයෙන් කියැවේ. හුදෙක් ගිවිසුම් පෙට්ටියට ළංවී ඊට අත තැබූ පමණින් උස්සාට මරණයට පත්වීමට සිදුවූයේ මන්දැයි ඔහු දැන නොසිටියේය.

පළමුවෙන් ගිවිසුම් පෙට්ටිය පලස්තීනුවන් විසින්, ඊශ්‍රායෙල්වරුනට ආපසු භාර කළ බව 1 සාමුවෙල් 7 පරිච්ඡේදයේ කියවා ඇත. එය උස්සාගේ පියාවන අබිනාදාබ්ගේ නිවසේ, සමහරවිට වසර කීපයක් තැන්පත් කර තබන ලද්දේය.

ගිවිසුම් පෙට්ටිය ඒ සා දිගු කලක් සිය නිවසේ තැන්පත් කර තිබුන බැවින්, එය ගෞරවයෙන් සැළකීමට තරම් නොවන සාමාන්‍ය

දෙයක් ලෙස උස්සා සැළකුවේ යැයි යන්න මගේ විශ්වාසයයි. ඊට ළං වී අත ගැසීමට තරම් ඔහු නිර්භය වූයේ එබැවිනි. ගිවිසුම් පෙට්ටිය සමග සමීප කුළුපග බව ඔහු තුළ ගරුබිය හීන බවක් ජනිත කළේය. ඒ සඳහා ජීවිතයෙන් වන්දි ගෙවීමට ඔහුට සිදුවිය.

## කුළුපග බව බලය සීමා කරයි

**"එවිට යේසුස්වහන්සේ කථා කොට: අනාගතවක්තෘ කෙනෙක් තමාගේම රටේදීත් තමාගේම නෑයන් අතරේදීත් තමාගේම ගෙදරදීත් මිස ගෞරව නැතිව නොසිටී යයි කී සේක. එහිදී රෝගීන් ස්වල්ප දෙනෙකු පිට අත් තබා සුව කළා මිස කිසි බලවත් ක්‍රියාවක් කරන්ට උන්වහන්සේට නොහැකි වූයේය. ඔවුන්ගේ විශ්වාසය නැතිකම ගැන උන්වහන්සේ මවිත වූ සේක. උන්වහන්සේ උගන්වමින් අවට ගම්වල ඇවිද්ද සේක."**

ශු:මාර්ක් 6:4-6

කරුණු කාරණා පිළිබඳව ඕනෑවට වඩා කුළුපග වීම ගැන අප ඉතා ප්‍රවේශම් විය යුතුය. අප ඒවා සමග පමණට වඩා කුළුපග වූ විට, අපි ඒවාට දැක්විය යුතු ගෞරවය තවදුරටත් දක්වන්නේ නැත.

මිනිසුන් සමග ඕනෑවට වඩා කුළුපගවීම කෙරෙහිද එය එසේමය.

ආත්මික නායකයින්ට මිනිසුන් සමග අඹ යහළුවන් විය නොහැක්කේ මන්ද යන කාරණය මට දැන් වැටහෙයි. ඔවුන්ගේ උපස්ථායක සේවය ලබන මිනිසුන් කෙරෙහිද කාරණය එසේමය.

බොහෝ අවස්ථාවල මිනිසුන් සිය ආත්මික නායකයින් ඉතා හොඳින් දැන හැඳින ගත් කල එකී නායකයින් විසින් මිනිසුන්ට අවශ්‍ය කරන උපකාර සැපයීමට තරම් තත්වයකට නායකයෝ පත්

නොවෙති. ඉතා පහසුවෙන් ලබාගත හැකි දෙය අවතක්සේරු කිරීම මිනිස් ස්වභාව යයි.

ශු:මාර්ක් 6 පරිච්ඡේදයේ දක්වෙන පරිදි යේසුස්වහන්සේ ස්වකීය උපන් ගම වන බෙත්ලෙහෙමට වැඩිය සේක. එහි වූ සිනගෝගයෙහි උන්වහන්සේ දේශනා කිරීමට පටන් ගත් කල්හි බොහෝ දෙනා එතුමාණන් ගැන බාධා වූහ. ඔවුන්ගේ සිත් රිදුනි. ඔවුන් එතුමාණන්ව හඳුනා ගත්තේ මරියාගේ පුත්‍රයා ලෙසය. එතුමාණන්ගේ සහෝදර සහෝදරියන්ද ඔව්හු දැන සිටියහ. ඔවුන් එතුමාණන්ට සමීපව දැන හැඳින සිටීම ඔවුන් තුළ එතුමාණන්ට භක්තිය සහ ගෞරවය හීනවීමට හේතුවිය. ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට උපකාර කිරීමට එතුමාණන් තුළ වූ බලය සීමා විය. එබැවින් උන්වහන්සේ රෝගීන් කිහිප දෙනෙකු පමණක් සුව කළහ.

සමහර විට සභාපාලකයෝ තම සභාවේ කිසියම් අයෙකුට නොකඩවා යාච්ඤා කළද එම පුද්ගලයා තුළ කිසි දිනෙක නිදහස් වීමක් ඇති නොවීමට පිළිවන. එවන් අවස්ථාවක වෙනත් සභාවකින් පැමිණෙනන ඉවැන්ජලිස්තවරයෙකු ඔහුට යාච්ඤා කිරීමට පුළුවන. එවිට එකෙනෙහිම එකී පුද්ගලයා සුවය ලබන්නේය.

ඒ ඇයි? සභා පාලකවරයාට වඩා ඉවැන්ජලිස්ත වරයා වැඩි ආලේපයක් ලබා ඇත්තේද? වැඩි බලයකින් යුක්තද?

නැත. කරණය නම් රෝගී පුද්ගලයා සභා පාලකවරයා දෙස බලනවාට වඩා වෙනස් අයුරකින් ඉවැන්ජලිස්තවරයාව දැකීමය. ඔහු සිය සභාපාලකවරයාව සෑම සතියකම දකියි. එබැවින් ඔහු "ගජමිතුරු සභාපාලක ජෝ" බවට පත්වේ. සැමදෙනාම ඔහුට ආදරේ කරයි. ඔහු ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු බවද සියල්ලෝම දනිති. නමුත් තමන් නොදන්නා කෙනෙකු කෙරෙහි තබන තරමේ විශ්වාසයක් තමන්ගේ සභාපාලකවරයා කෙරෙහි නොතබයි.

ඉඳහිට හෝ තම සභාපාලකවරයා සාමාන්‍ය මිනිස් ස්වභාවයට පත්වනු ඔවුන් දැක තිබෙනවා විය හැක. සමහරවිට ඔහු සිය දරුවන්ට බෙරිහන්දෙනු හෝ ටිකක් මැසිවිලි නගනු ඔවුන් අසා තිබෙන්නට පුළුවන. එබැවින් හිටි හැටියේම ඔහු තමන් මෙන්ම සාමාන්‍ය පුද්ගලයෙකු වීම ඔවුන්ට අනුමත කළ නොහැක.

## නමුත් මෙහිදී ඔවුන් තේරුම් නොගන්නා කාරණය නම් පෙරකී ඉව

**"මොහු මරියාගේ පුත්‍රවූද යාකොබ්, යෝසප්, යුදස් සහ සීමොන්ගේ සහෝදරවූද වඩුවා නොවේද? මොහුගේ සහෝදරියෝ මෙහි අප අතරේ සිටිනවා නොවේද කියා උන්වහන්සේ ගැන බාධා වූහ.**

ශු:මාර්ක් 6:3

එතුමාණන්ගේ අධිකාරීත්වය පිළිගැනීමට මෙය ඔවුන්ට බාධාවක් විය. සමහර අවස්ථාවල කෙනෙකු ගැළවීම ලබා ඔහුගේ ජීවිතය කෙරෙහි දෙවියන්වහන්සේගෙන් කැඳවීමක් ලැබූ කල ඔහුගේ පවුලේ සාමාජිකයින්ට සහ නෑදෑයින්ට එම කැඳවීම පිළිගත නොහැක.

ඒ ඇයිද කියා ඔබ දන්නෙහිද? හේතුව නම් ඔවුන් ඔහු සමග ඉතා සමීප බවක් දක්වීමය. තමන් විසින් ඔහුට දිය යුතු ගෞරවය නොදක්වීම තරම් ඔහු ගැන ඔවුන් දැන සිටිනවා වැඩිය.

අප විසින් මේ පරිච්ඡේදය තුළ දක්නා පරිදි ඕනෑම කෙනෙකුට මෙසේ සිදුවිය හැකිය. යේසුස්වහන්සේට පවා එසේ සිදුවිය හැකිය. එතුමාණන්ගේ සහෝදරයින් පවා එතුමාණන් කෙරෙහි අදහා නොගත්තේ යැයි බයිබලය පවසයි. (ශු:යොහන් 7:5)

අනෙක් මනුෂ්‍යයින් පිළිගන්නාක් මෙන් මගේ සේවය පිළිගැනීමට අකමැති නැයින් තවමත් මට සිටිති. "ඔබ දැන් අතිශය හැකියාව ඇති කෙනෙකු වෙන්ට ඇති. නුමුත් ඔබ ....... ව සිටිය බව අපි දනිමු" යැයි මට මුහුණටම කියා ඇත.

බොහෝ අවස්ථාවල අපව අපේ අතීතයෙන් මිදීමට සමහර උදවිය ඉඩ නොදෙති. නමුත් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ පවතී නම්, ඔහු අළුත් මැවිල්ලක් බවද, "**පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත් වී තිබේ**" යැයිද බයිබලය පවසයි. **(2 කොරින්ති 5:17)**

නාමය ආමන්ත්‍රණය කරනවාට වැඩි යමක් ඒ තුළ ඇතැයි තේරුම් නොගෙන එය නොසැළකිලිමත් ලෙස අතන මෙතන විසි කිරීමට තරම් අපි යේසුස්වහන්සේගේ නාමය පිළිබඳව පමණට වඩා කුළුපග සමීප බවක් ඇති කර නොගත යුතුය.

මම ඔබ ගැන නොදනිමි. නුමුත් මා "යේසුස්" යන නාමය ආමන්ත්‍රණය කරන විට ඒ තුළ ඇති ආලේපය සැබවින්ම මට දැනෙයි. මගේ රැස්වීම්වල මා එය අමතන විට මිනිස්සු ගැළවීම හා සුවය ලබති. ශුද්ධාත්මයෙන් පූර්ණ වෙති.

එවැනි ප්‍රතිඵල සේවය තුළ මිනිසුන්ට පමණක් සීමා නොවේ. උත්කෘෂ්ඨ වූ ඒ නාමය පිළිබඳව ගෞරවයක් හා භක්තියක් තිබීම සෑම ඇදහිලිවන්තයෙකු විසින්ම අවබෝධ කර ගැනීම උදෙසා මා තුළ ගැඹුරු ආශාවක් ඇත්තේ එහෙයිනි. අප තුළ එවැනි ගරු බියක් ඇති වූ කල නාමය තුළ ඇති බලය උදෙසා අපි විවෘත වන්නෙමු. එනම් අපේම හේතු කාරණා මෙහෙ වීමටත් සාමාන්‍ය තත්වය අභිබවා අන්‍යයන්ට සේවය කිරීමටත් එම බලයට විවෘත වන්නේයි

# 6

# නාමය සහ සබඳතා

"මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූ සේක. එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස් කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේ දුන් සේක. එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව් වලින් ඒත්තු ගන්න පිණිසත්ය."

පිලිප්පි 2:8-11

අපගේ කතා බහට ලක්වෙන, මෙම පරිච්ඡේදයේ දක්වෙන ස්වාමින්වහන්සේ, ගැළවුම්කරුවාණෝ යන වචනය (ශුːයොහන් 1:1), දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ (ශුːයොහන් 1:29), ජීවනයේ කෑම (ශුːයොහන් 6:35), ස්වාමීන්ගේ ස්වාමීන් සහ රජුන්ගේ රජු (එළිදරව් 17:14) ආදී විවිධ වෙනස් නාමවලින් ඉතා බල සහිත බවට විස්තර කෙරෙන නාමය යේසුස්වහන්සේට ලැබුණේ කෙසේද?

එතුමාණන්ට එම නාමය ලැබුණේ අතිශයින් **"කීකරුවීම"** නිසායි අප මේ වන විටත් කීකරුකම ගැන සාකච්ඡා කර ඇත. නමුත් නාමය සම්බන්ධව එහි තවත් පැත්තක් ඇත. ඒ පිළිබඳව ඊ ළඟට කථා කිරීමට මට උවමනාය.

## කීකරුකම සහ සම්බන්ධතාවය

> **"ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරන සේක්, දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගනම සිටිය යුතු වූ වස්තුවකැයි නොසිතා, එය ඉවත් කර, දසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණි සේක."**
>
> **පිලිප්පි 2:5-7**

මේ පරිච්ජේදය තුළදී (පිලිප්පි 2:8-11 දක්වා පදවල විස්තර කෙරෙන ප්‍රකාර) යේසුස්වහන්සේගේ කීකරුකමේ ක්‍රියාවට පෙර එතුමාණන්ට පියාණන්වහන්සේ සමග පූර්ව පැවැත්මක් සහ අඛණ්ඩව පැවතෙන සම්බන්ධතාවයක් තිබුණි.

යේසුස්වහන්සේගේ නාමය භාවිතා කිරීම අපගේ ජීවිත තුළ බලවත් ප්‍රතිඵල ඇති කරලීමට නම් උන්වහන්සේ ස්වර්ගයෙහි පියාණන්වහන්සේ සමග තිබුණා වැනි වූ සම්බන්ධතාවයක් අපිද එතුමා සමග ඇති කර ගත යුතුය.

පුද්ගලයෙකු සමග සම්බන්ධතාවයක් පැවැත්වීමට එම පුද්ගලයා සමග කාලයක් ගත කිරීමට අවශ්‍යය. ස්වාමින්වහන්සේ සමග සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට නම් අපි එතුමාණන් සමග සහභාගිකම් පවත්වමින් උන්වහන්සේ සමග නියමිත කාල වේලාවක් ගත කළ යුතුය. එය සරලව පවසන්නේ නම් උන්වහන්සේට දිනපතා

කථා කිරීමද, නිතිපතා එතුමාණන්ගේ වචනය කියවීමද අපේ ජීවිත සමග සම්බන්ධ වීමට එතුමාණන්ට ඉඩ සැලසීමකි.

කැපවීමකින් තොරව එතුමාණන් සමග සැබෑ සම්බන්ධකමක් පවත්වාගෙන යා නොහැක. ඒ වනාහි විවාහයක් තුළ ඇති කර ගන්නා සම්බන්ධතාවයක් හා සමානය.

## නාමය පාවිච්චි කිරීමට අප විවාහ විය යුතුය

"මනමාලී ඇත්තා මනමාලයාය..."

ශු:යොහන් 3:29

යේසුස් වහන්සේ තමන් වහන්සේ මනාලයා ලෙසද සභාව මනාලි ලෙසද බයිබලයේ හඳුන්වයි.

මනාලියක සහ මනාලයෙකු සිටීමට නම් එතැන විවාහයක් තිබිය යුතුය. ඉදින් විවාහය, මනාලයා සහ මනාලී අතර සදතනික පෞද්ගලික සම්බන්ධතාවයක් (බැඳීමක්) ඇති කරයි.

ඩේව් මේයර් හා විවාහ වූ පසු මම ඔහුගේ නම භාවිතා කිරීමට පටන් ගත්තෙමි. මම ඩේව් මේයර් මහත්මිය බවට පත් වුණෙමි. දැන් ඩේව් මේයර් නාමය නියෝජනය කරන සියල්ල කෙරෙහි මට අධිකාරී බලය ඇත.

විවාහ වීමට පෙර, මට කිසිම දෙයක් තිබුණේ නැත. ඔහුට නවීන මෝටර් රථයක් සතුව තිබුණි. අප දෙදෙනා ස්වාමියා සහ භාර්යාව වූ මොහොතේම, මම එම මෝටර් රථයේ හිමිකාරිය වුයෙමි.

එසේම, විවාහයට පෙර මම ණයකාරියක් වී සිටිමි. විවාහ වූ මොහොතේම, ඩේව් ද එම ණයට පංගුකාරයෙකු විය.

පෞද්ගලිකව අප දෙදෙනා සතුව තිබූ සියල්ල හවුලේ අප දෙදෙනාගේ අයිතිය බවට පත් විය. මන්ද අප දෙදෙනා එකිනෙකා සමග විවාහ සම්බන්ධයක් ඇති කර ගත් බැවිනි.

සම්බන්ධතාවය පටන් ගත්තේ අපි විවාහය දින නියම කරගත් දවස් පටන් නොවේය. ඒ දවසේ මට ඩේව්ගේ නමේ අයිතිය නොලැබිණ. එසේම, ඒ නම නියෝජනය කරන කිසිවක් හෝ පිළිබඳව අයිතිය අප විවාහ පත් වන තෙක් මට නොලැබිණ.

යේසුස්වහන්සේ පිළිබඳ කාරණාවේදී වුවද සිද්ධාන්තය මේ හා සමානය. අප උන්වහන්සේ සමග විවාහ පත් වන තෙක් එතුමාණන්ගේ නාමය තුළ ඇති බලය හෝ එකී නාමය තුළින් ප්‍රදනය කෙරෙන කිසිවක් අප සතු වන්නේ නැත.

මෙහිදී උද්ගත වන ගැටළුව වන්නේ බොහෝ කිතුණුවන් යේසුස් වහන්සේ සමග බැඳීමක් ඇති කරගැනීම දින නියම කර ගන්නවා පමණක් වීමය. මන්ද ඔවුන්ට තමන්ටම ගැළපෙන රටාවකට තමන්ගේ ජීවිතය නිදහසේ ගත කිරීමට උවමනාය. තමන් සන්තක සියල්ල එතුමාණන්ට  කැප කිරීමට ඔවුන්ට උවමනා නැත. පූර්ණ කැපකිරීමක් කිරීමට ඔවුන්ට උවමනා නැත.

එසේ වුවද තමන් කරදරයකට පත් වූ කල හෝ තමන්ට විපතක් වූ කල, "අහෝ යේසුස්වහන්ස, අපි දිනයක් නියම කර ගනිමු, අහෝ යේසුස්වහන්ස, මට මුදල් ටිකක් උවමනායි, අහෝ යේසුස්වහන්ස, අපි දිනයක් නියම කර ගනිමු" ආදී වශයෙන් අපි ප්‍රකාශ කරමු.

මුදල් සපයා ගැනීම, සුවය ලැබීම හෝ මිදීම ලැබීම නොඑසේනම් තම වෙනත් අවශ්‍යතාවයකදී පමණක් එතුමාණන්ගේ නම ඇමතීමට හැකියාව පහසුකම ලබා ගැනීමට ඔවුන්ට උවමනාය. නමුත් මුළුමණින්ම, සියලු කල්හි එතුමාණන්ට අයිති වීමට ඔවුන් තුළ උවමනාවක් නැත.

ඉඳහිට තමන්වහන්සේ සමග දින නියම කර ගන්නවාට යේසුස්වහන්සේ තුළ උනන්දුවක් නැත. එතුමාණන්ට අවශ්‍ය කරනුයේ අප සමග තිරසාර සම්බන්ධතාවයක් ඇති කර ගැනීමටයි.

අපේ ඇඟිල්ලේ මංගල මුදුවක් පළඳවා අප විවාහ කර ගැනීමට එතුමාණන්ට උවමනාය.

අප එතුමාණන්ව අපේ ස්වාමිපුරුෂයා කොට භාරගැනීම එතුමිණන්ට උවමනාය. අපේ එකම ස්වාමින් හා හාම්පුතා ලෙස අප එතුමන් පිළිගැනීම එතුමාණන්ගේ අපේක්ෂාවයි. (යෙසායා 54:5)

මෙහිදී මතුවන ගැටළුව නම් එබඳු කැපකිරීමක් කිරීමට අප බොහෝ විට අකමැති වීමය. අපට නාමය භාවිතා කිරීමට පමණක් උවමනාය. නමුත් **අප විවාපත්වන තුරු නාමය පිළිබඳ අයිතිය අපට නොලැබෙන බව අප විසින් තේරුම් ගත යුතුය.**

මා ඔහු හා විවාපත් වන තෙක් මගේ ස්වාමි පුරුෂයාගේ නමේ අයිතිය මා සතු නොවීය. අප දින නියම කරගෙන සිටිතාක් කල් මට ඔහුගේ නම අත්සන් කිරීමට සහ ඔහුගේ බැංකු ගිණුමෙන් මුදල් ලබා ගැනීමේ අයිතියක් නොවීය. නමුත් අප විවාපත් වූ මොහොතේ පටන් බැංකුවේ ඔහු සතු ඕනෑම දෙයක් ලබා ගැනීමේ හැකියාව නීතිමය අයිතිය මට ලැබිණ. මන්ද ඔහු සතුව තිබූ සියල්ල මා සතුය. එහි අනෙක් පැත්තද එසේමය. මා සන්තක සියල්ලද ඔහුගේය.

යේසුස්වහන්සේ කලකට පෙර මට මෙසේ පැවසූහ. (කණට ඇසෙන සේ නොව හදවතට කතා කරමිනි.) "ඔබ සතු සියල්ල ඔබ මට දෙන්නේ නම්, මා සතු සියල්ල මම ඔබට දෙමි. මා සතු සියල්ල ඔබේ පාලනයට යටත් කරමි. නමුත් ඔබ මට අයිති විය යුතුය.

වෙනත් වචනයෙන් කිවහොත්, අපේ මුළු අවධානය එතුමාණන් කෙරෙහි යොමු වීම එතුමාණන්ගේ අපේක්ෂාවයි. මුළු ශක්තියෙන් අප එතුමාණන් පසුපස යාමයි. එතුමාණන්ගේ අපේක්ෂාව වන්නේ අප මුළුමනින්ම එතුමාණන්ට කැප වීමයි.

එතුමාණන්ගේ බලය පැමිණෙන්නේ එතුමාණන් සමග ඇති කරගන්නා සම්බන්ධතාවය තුළින් පමණි. එතුමාණන්ට අයිතිවීම තුළින් පමණි.

## අයිතිවීම බලය ලබාදෙයි

**"නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක."**

**ශුඃයොහන් 1:12**

මගේ ජීවිතය තුළ මට හැඟීමක් අවබෝධයක් ඇත. එය සැම විටම වර්ධනය වෙමින් පවතී. ඒ මා දෙවියන්වහන්සේට අයිතිය යන හැඟීමය.

මා මින් අදහස් කරන්නේ කුමක්ද?

මට මා අයිති නැත. මට උවමනා දේ කරමින්, මට උවමනා ඕනෑම ආකාරයකට ක්‍රියා කරමින්, මට ඕනෑ යයි හිතෙන ඕනෑම දේකට මුදල් විය පැහැදම් කරමින්, මට උවමනා විදිය මිනිසුන්ට සළකමින් ජීවිතය පුරා ගමන් කිරීමට මට බැරිය.

මා කිරීමට ආශා කරන බොහෝ දේවල් කිරීමට දෙවියන්වහන්සේ මට ඉඩ සලසන සේක. දවසේ කරන ඉතා කුඩා දේ පවා උන්වහන්සේ කැමැත්තට එකඟදැයි විමසමින් මම කරදරයට පත් නොවෙමි.

දවසේ සාමාන්‍ය චර්යා කටයුතු වලදී ශුද්ධාත්මයාණන් වහන්සේ අප මෙහෙයවන බව මම විශ්වාස කරමි. ඉඳහිට පැන නගින සාමාන්‍ය මට්ටමෙන් එහා කටයුතු වලදීද එසේ ශුද්ධාත්ම මඟ පෙන්වීම ලැබේ. නමුත් මා කරන්නට ආසන්න කිසියම් කටයුත්තක් සඳහා මට දෙවියන්වහන්සේගෙන් සංඥාවක් ලැබෙන කල මම වහාම එය නවත්වමි.

මා එසේ කරන්නේ ඇයි? මන්ද දෙවියන්වහන්සේගේ අභිමුඛය මට අහිමි වේ යැයි යන ගෞරවය මිශ්‍ර බියක් මා තුළ ඇති වන බැවිනි.

එසේය, මම බිය වෙමි. නමුත් නියම ආකාරයෙන් බිය වෙමි. මා බිය දක්වන්නේ දෙවියන්වහන්සේට නොව තමන් වෙත දේව වචනය සහ දෙවියන්වහන්සේගේ බලය ගෙන ඒම පිණිස මා දෙස යොමු වී සිටින දහස් ගණන් මිනිසුන් ඉදිරියේ නැගී සිටීමටය. මා දෙවියන්වහන්සේගේ අභිෂේකය සහ අභිමුඛය අහිමි කරගත හොත් ඔවුන් තුළ කිසිවක් සිදු නොවනු ඇත.

මෙය බිය ගෙනදෙන සුළුය.එය එසේම විය යුතුය. එය මා යාච්ඤාවේ සහ කීකරු කමේ රඳවා තබයි. මා රූපවාහිණිය නරඹද්දී දෙවියන්වහන්සේගේ නාමය නිකරුණේ භාවිතා වන විට මා එය වසා දමන්නේ එකී බිය නිසාය.

මා පොරොන්දුවකින් දෙවියන්වහන්සේට කැප වුණෙමි. මා අයිති වන්නේ ඔහුටයි, මෙහි ප්‍රතිඵලය වූයේ, එතුමාණන්ගේ නාමයෙන් මම යාච්ඤා කරන විට, එතුමාණන්ගේ බලය, වේලාවෙන් වේලාවට අත් දැකීමයි.

බොහෝ කිතුණුවෝ දෙවියන්වහන්සේට කැපවීමක් නොකර කිසිදක එතුමාණන්ගේ බලය තම ජීවිත කාලයටම අත් නොදැකීම විශ්මය ගෙන දෙන සුළුය. ඔව්හු ගැළවීම ලැබ සිටිති. ඔවුන් යම් දිනෙක මිය ගිය කල ස්වර්ගයටද යනු ඇත. නමුත් ඔවුන් මේ පොළොව මත ගත කරන්නේ බලයෙන් පූර්ණ ජීවිතයක් නොවෙයි.

එතුමාණන්ට අයිතිවීම මගින් බලය ලැබෙන බව ඔව්හු නොදනිති.

ඔවුන් කැපවීමක් නොකරන එක් හේතුවක් නම් "කැපවීම" යන වචනය ඔවුන් තුළ කිසියම් අපහසු හැඟීමක් ඇති කරයි. තමන්ට යමක් අත්හැර දැමීමට සිදුවේ යැයි ඔව්හු කල්පනා කරති. ඇත්තෙන්ම සිදු වන්නේ සියල්ල අත්හැර දැමීම නොව සියල්ල ලැබීමය. (ශු:මතෙව් 19:29 බලන්න)

ස්වාමින්වහන්සේ ඔබෙන් පරිපූර්ණත්වය බලාපොරොත්තු වේයැයි නොසිතන්න. ඔබ එතුමාණන්ට අයිති වන කල, ඔබේ කැපවීම එතුමාණන් කෙරෙහි යොමු කිරීමට එතුමාණන්ගේ උපකාරය කෙරෙහි ඔබට විශ්වාසය තැබිය හැකිය.

ඔබට හැකි දේ පමණක් ඔබ කරන්න. ඔබට කළ නොහැකි දේ කිරීමට උන්වහන්සේ ඔබට උපකාර කරන සේක.

ස්වාමින්වහන්සේට කැපවීම යනු දෙයාකාර ගිවිසුමකි. අපි අපේ සියල්ල උන්වහන්සේට කැප කරමු. සෑම කල්හි අප සමග සිටීමට උන්වහන්සේ කැප වී සිටින සේක.

උන්වහන්සේ අප සමග වැඩ සිටින්කොලයකදීම (අපට උපකාර අවශ්‍ය වූ විට)

අපෙන් කෙසේද?

ස්වකීය නාමය තුළ එතුමාණෝ අප සමග සිටින බව අමතක කරන්න එපා. අපි ඒ නාමය ආමන්ත්‍රණය කරන සෑම නිදහස්' ජීවිත වෙනුවෙන් උන්වහන්සේ සැලසුම් කර ඇති සියල්ල සම්පූර්ණ කර ගැනීමට උන්වහන්සේ ඒ මොහොතේ අප බලවත් කරන අතර, අප සමග වැඩ වසන සේක.

යේසුස්වහන්සේගේ විශ්මිත නාමය තුළ බලය ඇත. අපට උපකාර කිරීම පිණිස අප සුව කිරීම පිණිස මූලික වශයෙන් බලය පාවිච්චි කිරීමට එතුමා කැමැත්තෙන් සිටින සේක.

මේ මොහොතේ පටන් සියළු නාමයන්ට වඩා උසස් නාමය වන යේසුස් වහන්සේගේ නාමය තුළ අන්තර්ගත බලය තුළ ඉදිරියට යාමටත් ජීවිතයේ සෑම දවසක්ම එතුමන්ට කැපව ගත කිරීමටත් භාරයක් වීමට දිව්රුමක් දීමට ඔබට හැකිවේවායි මම යාච්ඤා කරමි.

# මාප්තිය

"නුඹලා මේක කළේ මොන බලයෙන්ද නොහොත් මොන නාමයෙන්දැයි විචාළෝය. එවිට පේතෘස් ශුද්ධාත්මයෙන් පූර්ණව, ඔවුන්ට කියනුයේ: සෙනගගේ මුලාදෑනියෙනි, වැඩිමහල්ලෙනි, දුර්වල මනුෂ්‍යයෙකුට කළා වූ යහපත් ක්‍රියාවක් ගැන, ඔහු සුව කරනු ලැබුවේ කොයි විධියෙන්දැයි අද අපි විභාග කරනු ලබමු නම්, නුඹලා විසින් කුරුසියෙහි ඇණගසන ලද්ද වූද දෙවියන්වහන්සේ විසින් මළවුන්ගෙන් නැගුටුවන ලද්ද වූද නාසරීය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් මේ මනුෂ්‍යයා නුඹලා ඉදිරියෙහි සුවපත්ව සිටීයයි නුඹලා සියල්ලෝද සියලුම ඉශ්‍රායෙල් සෙනගද දැනගනිත්වා."

ක්‍රියා 4:7-10

යේසුස්වහන්සේගේ නාමය පිළිබඳව "ඇතිය" කියා සීමාවක් පැනවිය නොහැක. ස්වර්ගයෙහිද පොළොවෙහිද උන්වහන්සේගේ නාමය අන් කවරකටත් වඩා බලවත්ය. ජීවිතයේ කුමන හෝ තත්වයක් සඳහා ඇදහිලිවන්තයින් ලෙස එකී නාමය භාවිතා කිරීමට අපට බලය දී තිබේ.

දෙවියන්වහන්සේගේ දරුවෙකු, අනෙක් කිතුණුවන් කරන දේ කරමින්ද යාච්ඤා කරමින්ද නමුත් ප්‍රතිඵල ලැබීම සඳහා සිය ජීවිතය තුළ කිසිම බලයක් අත් නොවිඳිමින්ද සිටිනු දැකීම තරම් දුක්මුසු තවත් කිසිවක් ඇතැයි මම නොසිතමි.

**ලෝකයා තුල ඇති දුබලකම් අපගේ උරුමය නොවේය.**

යේසුස්වහන්සේ කුරුසිය මත දිවි පුද තුන්වෙනිද යළි නැගිටින පිණිස අප වෙනුවෙන් ලෝකයට වැඩියේ අප දුබලව පරාජිතව සිටිනු පිණිස නොවේය. උන්වහන්සේ ඒ සියල්ල තුළින් ගියේ අපට මේ ජීවිතය තුළ උරුමයක් අධිකාරීත්වයක් බලයක් ලබාදීම සඳහාය. ඒ සියල්ල ලබා දෙනුයේ අපගේ ජීවිතයේ සියලු කාරණා අප විසින් පාලනය කරනු සඳහාය.

ස්වාමින්වහන්සේ පෙන්වා දුන්, එකී බලය ලබාගැනීම සඳහා වූ මූලික පියවර සියල්ල මේ පොතේ මා ඔබ සමග බෙදා ගතිමි. ඒ බලය ඔබ ලබා ගන්නේ යේසුස්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ල තුළින් බවත්, එතුමාණන්ගේ නාමය කෙරෙහි ඇදහිල්ලෙන් යුතුව යාච්ඤා කිරීම තුළින් බවත්, එතුමාණන්ගේ නාමය කෙරෙහි දක්වන ගෞරවාන්විත බිය තුළින් බවත් එතුමාණන් සමග සම්බන්ධ වීමෙන් බවත් සිහි තබා ගන්න.

ඔබ මෙකී ප්‍රතිපත්ති ඔබේ ජීවිතය තුළ භාවිතා කිරීමට පටන් ගත් කල ඔබට යහපත් දේ සිදු වෙන්නට යන බව මම විශ්වාස කරමි.

සෑම අවශ්‍යතාවයක්ම සපුරා ගැනීම සඳහා වූ බලය ඔබට ලබා දී ඇත. ඒ අවශ්‍යතා සම්බන්ධයෙන් යේසුස්වහන්සේගේ නාමය භාවිතා කිරීමට ඔබට ඇති අයිතිය ඔබ ක්‍රියාත්මක කරන කල අන් සියලු නාම වලට වඩා උසස් නාමය වන යේසුස්වහන්සේගේ නාමයෙන් ඒ සියල්ල වෙනස් වන අයුරු ඔබ දැකගනු ඇත.

# ස්වාමින්වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවයක් ඇති කර ගැනීම සඳහා යාච්ඤාව

දෙවියන්වහන්සේ විසින් නොමිලේ ලබා දෙන එතුමාණන්ගේ දීමනාව වන ගැළවීම ඔබ ලබාගැනීම උන්වහන්සේගේ බලාපොරොත්තුවයි. අන් කවරකට හෝ වැඩියෙන් ඔබව රැක ගැනීම සහ ඔබව ශුද්ධාත්මයාණන්ගෙන් පිරවීමටයි. සාමයේ කුමරුන් වන යේසුස්වහන්සේට, ඔබේ ස්වාමියා සහ ගැළවුම්කරුවාණන් වීමට ඔබ කිසි දිනෙක ඇරයුම් කර නොමැති නම්, දැන් එසේ කරන මෙන් මම ඔබට ආරාධනය කරමි. ඔබ අවංක නම්, ඔබ ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජීවිතයක් අත් විඳිනු ඇත.

**පියාණෙනි,**

ඔබවහන්සේ ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහා ගන්නා කිසිවෙකු හෝ විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිස අප පව් උදෙසා මැරෙනු සඳහා ඔබවහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් අපට දෙන තරම් අපට ප්‍රේම කළ සේක.

ඔබවහන්සේගේ දීමනාවක් වන ඇදහිල්ල නිසා, ඔබවහන්සේගේ අනුග්‍රහයෙන් අප ගළවනු ලබන බව ඔබගේ වචනය පවසයි. ගැළවීම ලබාගැනීම පිණිස අප විසින් කළ හැකි අන් කිසිවක් නොමැත.

යේසුස්වහන්සේ ඔබවහන්සේගේ පුත්‍රයාණන් බවත්, ලෝකයේ ගැළවුම්කරුවාණන් බවත් මම විශ්වාස කර මගේ

මුවින් ද ප්‍රකාශ කරමි. තවද උන්වහන්සේ මාගේ පාප වල කුලිය ගෙවමින් කුරුසිය මත මළ බවද, ඒ පිට මාගේ සියලු පාපවලට වන්දි ගෙවූ බවද මම අදහමි. ඔබවහන්සේයේසුස්වහන්සේව මරණින් නැගිටවූ බවද මම මුළු සිතින් විශ්වාස කරමී

මාගේ පාප කමා කරන මෙන් මම ඔබවහන්සේගෙන් අයදිමි. යේසුස්වහන්සේ මාගේ ස්වාමින් බව මම මුවින් ප්‍රකාශ කරමි. ඔබවහන්සේගේ වචනය අනුව මම ගළවනු ලැබීමි. තවද සදකාලිකව ඔබ සමග ගත කරන්නෙමි. ස්තුතියි!

පියාණෙනි, මම යේසුස්වහන්සේගේ නාමයෙන් බොහෝ සේ ඔබට කෘතඥ වෙමි. - ආමෙන්!

ශු:යොහන් 3:16, එපීස 2:8,9, රෝම 10:9,10, 1 කොරින්ති 15:3,4, ශු:යොහන් 1:9, 4:14-16, 5:1,12,13 බලන්නී

# අවසාන සටහන්

**2 පරිච්ඡේදය**
ඇදහිලිවන්තයෝ...... "ශුද්ධාත්මයාණන් විසින් මග පෙන්වනු ලබති. එනම් ගුරුවරයා විසින් මග පෙන්වනු ලබන සිසුවෙකු වශයෙන්ද, කපිතාන්වරයා විසින් සූදානම් කරනු ලබන සෙබලෙකු වශයෙන්ද, සංචාරකයාට මග පෙන්වන්නෙක් මෙන්ද, මෘගයින් මෙහෙයවන්නන් ලෙස නොව, බුද්ධිමත් යටහත් පහත් තැනැත්තන් පෙරටු කොටගෙන යන්නෙක් ලෙසද, මිනිසකුගේ ලණුවලින් නොව ප්‍රේමයේ බැමි වලින් ඇදගෙන යනු ලබන්නෙක් ලෙසද, කීකරුකමින් ඒ මග පෙන්වීම යටතේ සියලු යුතුකම් වෙත මෘදු ලෙස මග පෙන්වනු ලබති." මුළු බයිබලය අලලා මැතිව් හෙන්රි මහතා විසින් සම්පාදිත අටුවාව විද්‍යුත් දත්ත පදනම් කරගෙන කරන ලද නව නූතන අතිරේකය හිමිකම් 1991 හෙන්ඩ්‍රික්සන් ප්‍රකාශකයෝ අනුබද්ධිත "රෝම 8:10-16 ඇදහිලිවන්තයින්ගේ වරප්‍රසාද" අවසරය මත භාවිතා කරන ලදී. හිමිකම් ඇවිරිණි.

**3 පරිජේදය**
අපේ පාප වලට පූර්ණ කමාව (දඬුවමින් පූර්ණ නිදහස) යේසුස්වහන්සේගේ ලේ තුළින් ලැබිය හැකි බව බයිබලය උගන්වයි. අපේ ශරීරවල ක්‍රියාත්මක වන රුධිර සංසරණය, අපගේ ශරීර තුළ

ඇති අප ද්‍රව්‍ය සෝදමින් අපේ මුළු ශරීරයම පිරිසිඳු කරන අඛණ්ඩ ක්‍රියාවලියකි. නොඑසේ නම් ඒ අපද්‍රව්‍ය විෂ බවට හැරෙයි. ඒ අයුරින්ම, අපි අපේ පාප දෙවියන්වහන්සේට කියා දෙන විට, අපේ පාප උදෙසා කුරුසිය මත මැරෙද්දී යේසුතුමන් වැගිරූ) එතුමාණන්ගේ ලේ, අපගේ අභ්‍යන්තර මනුෂ්‍යයාව ආත්මිකව පාප නිරතුරුවම සෝද පවිත්‍ර කරයි. (1 යොහන් 1:7-9 පද බලන්න)

අපගේ පාප පොළොවේදී කමා කිරීමට මට (යේසුස්වහන්සේට) බලය ඇතැයි ශු:මතෙව් 9:5 පදයෙන් පවසයි.

**4 පරිජේදය**

විලියම් ස්මිත් LLD (දේව ධර්මාචාර්ය) ස්මිත්ගේ බයිබල් ආකාරාදිය (පරන ටප්පන්,නිව් ජර්සිඃ ස්පයර් පොත්, ජෝව් ප්‍රකාශකයෝ අනුබද්දධිත ෆේලේමින් එච් රෙවෙල් සමාගම වෙනුවෙන් 1981)

පිටුව 213 "දෙවියන් වහන්සේ"

**5 පරිච්ජේදය**

[1] ජැමීසන් ෆවුසෙට් සහ බ්‍රවුන් අටුවාව විද්‍යුත් දත්ත හිමිකම් 1997 බයිබල් මෘදුකාංග "බිය" සියලු හිමිකම් ඇවිරිණි.

[2] "උස්සාගේ වරද ඉතා සුළු යැයි දක්නට ඇත. අබිනාදබ්ගේ පුතුන් වන ඔහු සහ ඔහුගේ සහෝදර අහියෝ ගිවිසුම් පෙට්ටිය රැගත් කරත්තය පදවා ගෙන යාම භාර ගත්හ. ගිවිසුම් පෙට්ටිය දිගු කලක් ඔවුන්ගේ නිවසේ තැන්පත් කර තිබීම නිසාද කලක් තිස්සේ ඊට තේවා පැවැත්වීමේ නිරතව සිටි නිසාද, කිසියම් අහඹු සිදුවීමක් නිසාද ගිවිසුම් පෙට්ටිය පෙරළී යාමේ අවදානමක් ඇති විය. එහිදී උස්සා එය නොවැටෙන පිණිස එයට අත තැබීය. උස්සා හොඳ අදහසින් එසේ කළ බවට හේතු දැක්විය හැකිය. එසේ කළේ ගිවිසුම්

පෙට්ටිය කීර්තිය ආරක්ෂා කිරීම පිණිසත් ඇති වෙන්නට ගිය අසුභ නිමිත්ත වළකාගනු පිණිසත්ය. නමුත් මෙය මොහු කළ අපරාධයක් විය. උස්සා ලෙවීයෙක් විය. නමුත් ගිවිසුම් පෙට්ටිය අත ගැසිය යුත්තේ පූජකයින් පමණි. මේ නීතිය කොහාත්වරුන්ට පනවන ලද්දකි. එනම්, ගිවිසුම් පෙට්ටිය රඳවන ලද පොලු වලින් අල්ලා එය ඔසවාගෙන යනවා මිස ශුද්ධ දේකට ඔවුන් අත නොගැසිය යුතුය. එසේ කළොත් ඔවුන් මැරෙන්නේමය. (ගණන් කථාව 4:15) උස්සා තුළ ගිවිසුම් පෙට්ටිය කෙරෙහි වූ සමීප බව සහ ඔහු නිරතුරුව ඊට තේවා පැවැත්වීම හේතුකොට ගෙන උස්සා තුළ බිය සැක බව නොමැති වන්නට ඇත. නමුත් ඊට සමාවක් නැත"

මුළු බයිබලය අලලා මතෙව් හෙන්රි විසින් සම්පාදිත අටුවාව, "2 සාමුවෙල් 6:6-11 ගිවිසුම් පෙට්ටියට අත ගැසූ බැවින් උස්සා මරණයට පත් කරන ලදී" යැයි සඳහන් කර ඇති

# කතුවරිය ගැන

ජොයිස් මේයර් 1976 සිට ශුද්ධ ලියවිලි පිළිබඳව ඉගැන්වීම් කර ඇත. 1980 සිට පූර්ණ කාලීන පූජක මෙහෙවරෙහි යෙදී ඇත. වැඩිම අලෙවිය වාර්තා කර ඇති 54 අධික ආනුභාව සම්පන්න පොත් සංඛ්‍යාවක් ලියූ කතුවරිය ඇයයි. වෙනස් ආකාරයකින් ජීවත් වීමේ රහස්, ඇදහිල්ලෙන් යුත් යාච්ඤාවේ සතුට, මිනිස් සිත නම් වූ යුධ බිම, එසේම 220කට අධික ශ්‍රව්‍ය කැසට් ඇල්බමයක්ද, දෘෂ්‍ය (වීඩියෝ) 90 ක්ද ඊට ඇතුළත්ය. ජොයිස්ගේ "වචනය තුළ ජීවනය" නම් වූ ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන් ඇමරිකා එක්සත් ජනපදයේ සහ ලොව පුරා සිටින මිලියන ගණන් මිනිසුන් අසති, දකිති. තවද ඇගේ ඉගැන්වීම් ටේප් පටි ද ජාත්‍යන්තර වශයෙන් රස විඳිති. ඇය "වචනය තුළ ජීවනය" සමන්ත්‍රණ වැනි සටහන් ලොව පුරා සංචාරය කරමින් බෙදා දෙයි. ජොයිස් සහ ඇගේ සැමියා වන ඩේව්, දරුවන් සිව් දෙනෙකුගේ මාපියන්ය. ඔවුන් මිසෝරි හි ශාන්ත ලුවිස්හි වාසය කරති